# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,305 - 2022 නොවැම්බර් මස 04 වැනි සිකුරාදා - 2022.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1904 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1974 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 නොවැම්බර් මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 නොවැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1901 - B 82397 — 5,403 (2022/11)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අධීමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2022 නොවැම්බර් මස 18 වනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය.)

*සැ. යු .* තමන් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රයෙහි ඉහලින් සඳහන් කිරීම අනිවාර්යය වේ.

01. *දත්ත පදනම් පාලක තනතුර* :

1.1 *වැටුප් පරිමාණය* : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 52,955-5 x 1,335/8 x 1,630- රු. 72,670 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 110,000 පමණ වේ).

1.2 *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන්වන දිනට වයස අවුරුදු 22 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

1.3 *අධ්‍යාපන සුදුසුකම්* :

පරිගණක විද්‍යාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

1.4 *පළපුරුද්ද*
බාහිර අයදුම්කරුවන් සඳහා - ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දත්ත පදනම් පාලකවරයෙකු ලෙස වසර පහක (05) පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා - ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වසර අටක (08) පළපුරුද්දක් ලබා තිබීම.

1.5 බඳවා ගැනීමේ ක්‍රමය.-ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

02. *ගබඩා භාරකරු තනතුර* :

2.1 *වැටුප් පරිමාණය* : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 32,330-3 x 380/10 x 445/4 x 660 - රු. 40,560 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 74,000 පමණ වේ).

2.2 *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

2.3 *අධ්‍යාපන සුදුසුකම්* :

අ.පො.ස. (උ.පෙළ) විභාගය විෂයයන් හතරකින් (පැරණි විෂය නිර්දේශය) හෝ නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එක් වරක දී සමත් වී තිබීම ;

සහ

සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට, ඉංග්‍රීසි භාෂාවට හා ගණිතයට සම්මාන සාමාර්ථ ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

2.4 *වෘත්තීය සුදුසුකම්* : සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය වෙතින් ලබාගත් ගබඩාකරණය/ගබඩා කළමනාකරණය පිළිබඳ සහතිකයක් ලබා තිබීම සහ දත්ත ඇතුළත් කිරීම (Data Entry) හා පරිගණක භාවිතය (Office Package) පිළිබඳ මූලික දැනුමක් ලබා තිබීම.

2.5 *පළපුරුද්ද* :
රජයේ හෝ පිළිගත් ආයතනයක ගබඩා කළමනාකරණය පිළිබඳ වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

2.6 *බඳවා ගැනීමේ ක්‍රමය*.-ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

03. **විදුලි කාර්මික තනතුර**

3.1 *වැටුප් පරිමාණය* : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 28,250-9 x 300/10 x 330/3 x 380 - රු.35,390 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 68,000.00 පමණ වේ).

3.2 *වයස් සීමාව* : අයදුම්පත් කැඳවීම අවසන් වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

3.3 *අධ්‍යාපන සුදුසුකම්* :
සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

3.4 *වෘත්තීය සුදුසුකම්* :-විදුලි ක්ෂේත්‍රයෙහි NVQ IVසහතිකයක් ලබා තිබීම.

3.5 *පළපුරුද්ද* : පිළිගත් ආයතනයකින් විදුලි/ඉලෙක්ට්‍රොනික/මිනුම් උපකරණ භාවිතය ආදී කාර්යයන් හි අවම වශයෙන් වසර 3කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

ශ්‍රව්‍ය දෘශ්‍ය ක්ෂේත්‍රයේ රැකියාවෙ හි නියුතු අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

3.6 *බඳවා ගැනීමේ ක්‍රමය*.-වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

04. **පෙදරේරු තනතුර**

4.1 *වැටුප් පරිමාණය* : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 28,250-9 x 330/10 x 330/3 x 380 - රු. 35,390 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 68,000.00 පමණ වේ).

4.2 *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන් වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

4.3 *අධ්‍යාපන සුදුසුකම්* :
සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(සටහන - ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව NVQ III හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම අනිවාර්ය නොවේ.)

4.4 *වෘත්තීය සුදුසුකම්* :-ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) NVQ IVසහතිකයක් ලබා තිබීම.

4.5 *පළපුරුද්ද* : පිළිගත් ආයතනයක පෙදරේරු ක්ෂේත්‍රයේ වසර 3 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

4.6 *බඳවා ගැනීමේ ක්‍රමය*.-වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

05. **පුහුණු කම්කරු (සිවිල්) තනතුර**

5.1 වැටුප් පරිමාණය : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9 x 270/10 x 300/6 x 330 - රු. 32,930 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 63,000.00 පමණ වේ).

5.2 *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන් වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

5.3 *අධ්‍යාපන සුදුසුකම්* :
සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(*සටහන* - ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව NVQ III සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.)

5.4 වෘත්තීය සුදුසුකම් :- වෘත්තීය පුහුණු අධිකාරිය/ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හෝ රජයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද ඉදිකිරීම් කාර්යයන් (සිවිල්) වලට අදාළව NVQ III සහතිකයක් ලබා තිබීම.

5.5 පළපුරුද්ද : රාජ්‍ය සේවයේ/පිළිගත් ආයතනයක ඉදිකිරීම් කාර්යයන් (සිවිල්) වලට අදාළව වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

5.6 *බඳවා ගැනීමේ ක්‍රමය.*-ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

06. පුහුණු කම්කරු (විදුලි) තනතුර

6.1 *වැටුප් පරිමාණය* : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9 x 270/10 x 300/6 x 330 - රු.32,930 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 63,000.00 පමණ වේ).

6.2 *වයස් සීමාව* : අයදුම්පත් භාරගන්නා අවසන් වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

6.3 *අධ්‍යාපන සුදුසුකම්* :
සිංහල හෝ දෙමළ භාෂාව, සහ ගණිතය ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(*සටහන* - විදුලි ක්ෂේත්‍රයට අදාළව NVQ III සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.)

6.4 *වෘත්තීය සුදුසුකම්* :-වෘත්තීය පුහුණු අධිකාරිය/ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හෝ රජයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද විදුලි/ඉලෙක්ට්‍රොනික/මිනුම් උපකරණ භාවිතය ආදී කාර්යයන්ට අදාළව NVQ III මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

6.5 *පළපුරුද්ද* : රාජ්‍ය සේවයේ හෝ පිළිගත් ආයතනයක විදුලි/ඉලෙක්ට්‍රොනික/මිනුම් උපකරණ භාවිතය ආදී කාර්යයන්ට අදාළව වසර 3කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

6.6 *බඳවා ගැනීමේ ක්‍රමය.*-ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

07. **භාණ්ඩ භාරගැනීමේ සහායක තනතුර**

7.1 වැටුප් පරිමාණය : 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9 x 270/10 x 300/6 x 330 - රු32,930 වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 63,000.00 පමණ වේ).

7.2 වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසන් වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

7.3 *අධ්‍යාපන සුදුසුකම් :*
සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

7.4 *වෘත්තීය සුදුසුකම් :-*ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක, මාස 05කට නොඅඩු මූලික සූපවේදී සහතිකපත්‍ර පාඨමාලාව/මූලික ආහාරපාන සහතික පත්‍ර පාඨමාලාව හදාරා සහතිකයක් ලබා තිබීම ;

හෝ

සූපවේදී හෝ ආහාරපාන සේවා ක්ෂේත්‍රයේ NVQ II සහතිකයක් ලබා තිබීම.

7.5 *පළපුරුද්ද :* තරු පංතියේ හෝටලයක/පිළිගත් ආයතනයක භාණ්ඩ භාර ගැනීමේ සහායක/මුළුතැන්ගෙයි සහායක/භෝජනාගාර සහායක ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

7.6 *බඳවා ගැනීමේ ක්‍රමය.-*ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

08. *සේවා නියමයන් හා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත් ව පත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයදුම්කරුවකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

09. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(*අ*) උප්පැන්න සහතිකය;
(*ආ*) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඇ*) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික;
(*ඈ*) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

10. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

11. තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

12. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

13. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

***ආදර්ශ අයදුම්පත්‍රය***

.................. *තනතුර*

01. (*අ*) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(*ආ*) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :————.

(*ඇ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs. /Miss) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

03. (*අ*) පෞද්ගලික ලිපිනය :————.

දුරකථන අංකය :- | | | | | | | | | | |

(*ආ*) කාර්යාලයීය ලිපිනය :————.

දුරකථන අංකය :- | | | | | | | | | | |

(*ඇ*) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික : [ ] කාර්යාලයීය : [ ]

04. (*අ*) උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු :————. මාස :————. දින :————.

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක)

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත)

08. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

09. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)
..................................................................................................................................
..................................................................................................................................

10. වෙනත් සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

..................................................................................................................................
..................................................................................................................................

11. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) මුල් පත්වීමේ දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පතෙ හි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

— — — — — — — — — — — — — — — — — — — — — — — — —

*දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය*

*(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු, අයදුම්කරුවන් සඳහා පමණි)*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................................ තනතුර දරන .........................................
මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිරකර ඇති/නොමැති බවත් ඔහුගේ /ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

දිනය :————.

11-61

## ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරි පුරප්පාඩු- 2022

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරින් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා සුදුසුකම් සපුරා ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| අ. | විධායක | - | ජීව විද්‍යාව හෝ ගණිතය විෂය ධාරාවෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා එක් වරකදී විෂයයන් 03ක් සමත්ව තිබීම. |
| ආ. | ඉංජිනේරු | - | ගණිතය විෂය ධාරාවෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා එක් වරකදී සම්මාන සාමාර්ථ (C) 02ක් සහ සාමාන්‍ය සාමාර්ථයක් (S) සහිතව සමත්ව තිබීම. |
| ඇ. | සැපයුම් | - | වාණිජ විෂය ධාරාවෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා එක් වරකදී විෂයයන් 03ක් සමත්ව තිබීම. |
| ඈ. | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු | - | ගණිතය විෂය ධාරාවෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා එක් වරකදී සම්මාන සාමාර්ථ (C) 02ක් සහ සාමාන්‍ය සාමාර්ථයක් (S) සහිතව සමත්ව තිබීම. |
| ඉ. | විනයාරක්ෂක | - | ගණිතය,ජීව විද්‍යාව,වාණිජ,තාක්ෂණික හෝ කලා විෂය ධාරාවන්ගෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා එක්වරකදී විෂයයන් 03ක් සමත්ව තිබීම. |
| ඊ. | නාවික පාබල | - | ගණිතය, ජීව, විද්‍යාව, වාණිජ, තාක්ෂණික හෝ කලා විෂය ධාරාවන්ගෙන් අ.පො.ස (උ/පෙළ) හදාරා එක් වරකදී විෂයයන් 03ක් සමත්ව තිබීම. |

3. අනෙකුත් සුදුසුකම් ඃ

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවට බැඳීමට අයදුම්කරුවන් පහත සඳහන් මූලික සුදුසුකම් අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුයඃ

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. |
| ආ. | වයස | - | අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු22ට නොවැඩි විය යුතුය. |
| ඇ. | උස | - | අඩි 5 අඟල් 6 ට නොඅඩු විය යුතුය.<br>(විනයාරක්ෂක අංශය සඳහා අඩි 5 අඟල් 7 ට නොඅඩු විය යුතුයි). |
| ඈ. | බර | - | කි.ග්‍රෑම් 52 ට නොඅඩු විය යුතුය. |
| ඉ. | පපුව | - | අඟල් 32 ට නොඅඩු විය යුතුය. |
| ඊ. | වර්ණ දෘෂ්ඨිය | - | එස්ටීඩී II විය යුතුය. |
| උ. | දෘෂ්ඨි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) විය යුතුය. |
| ඌ. | අධ්‍යාපන සුදුසුකම් | - | අ.පො.ස සාපෙළ විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී මව්බස, ගණිතය සහ ඉංග්‍රීසි විෂයන්වලට සම්මාන (C) සාමාර්ථ සහිතව විෂයයන් 06 ක් සමත්වී තිබිය යුතුය. |
| | | - | අපොස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට ලකුණු 30 ට නොඅඩුව ලබාතිබිය යුතුය. |
| | | - | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන අ.පො.ස උසස්පෙළ විභාග සහතිකයේ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය. |

(විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද උසස්පෙළ විභාග සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය).

ඒ. සිවිල් තත්ත්වය - අවිවාහක විය යුතුය (කිසිදු කැඩෙට් නිලධාරියෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවනතුරු විවාහවීමට අවසර දෙනු නොලැබේ).

4. අ.පො.ස (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකා බලනු නොලැබේ.

5. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ දක්වා ඇති විශිෂ්ඨ දක්ෂතාවයන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේ දී විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

6. ඉහත සඳහන් 2. සහ 3. ඡේදයන් හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සේවා කොන්දේසි :**

අ. අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරීන් වශයෙන් බඳවා ගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු වේ. බඳවා ගැනීමේ අංශයන්ට අදාළ මූලික පුහුණුව සාර්ථකව නිම කරන කැඩෙට් නිලධාරීන් වැඩ බලන උප ලුතිනන් නිලයේ අධිකාරියට පත් කරනු ලැබේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවීම් සඳහා, බඳවාගනු ලබන සියලුම කැඩෙට් නිලධාරීන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව සියලුම කැඩෙට් නිලධාරීන් රාජකාරී හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ හෝ ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඈ. පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව සියලුම කැඩෙට් නිලධාරීන් දැනට පවතින ශ්‍රී ලංකා නාවික හමුදා පනත, ශ්‍රී ලංකා නාවික හමුදා නියෝග සහ සංදේශ මඟින් බලගන්වනු ලබන නීති හා උපදෙස්වලට යටත් විය යුතු අතර, මින් මතුවට පනවනු ලබන නීති හා උපදෙස්වලට යටත් වීමට ද බැඳී සිටිය යුතුයි.

ඉ. පුහුණුව ලබන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම් කැඩෙට් නිලධාරියෙකුගේ විනය විරෝධී නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම්, එම අවස්ථාවේ දී අදාළ කැඩෙට් නිලධාරියාගෙන් හෝ ඔහු නොගෙවන්නේ නම් ඇපකරුවන් විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමඟ ගිවිසුමකට සහ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

ඊ. පුහුණුවන කාල සීමාව තුළ දී යම් කැඩෙට් නිලධාරියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත්, ඒ සඳහා නාවික හමුදා ක්‍රියා පිළිවෙතට අනුකූලව ලිඛිතව අනුමැතිය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකා ජනරජය මඟින් එම කැඩෙට් නිලධාරියා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම කැඩෙට් නිලධාරියාගෙන් හෝ ඔහු නොගෙවන්නේ නම් ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

උ. පුහුණු කාලය තුළ දී සිදුවන අනතුරුවල දී සහ පූර්ණ කාලීන දුබලතාවල දී දැනට නාවික හමුදාවේ ක්‍රියාත්මක රක්ෂණය මඟින් ආවරණය සලසන අතර, ඒ සඳහා විශේෂ වන්දි ගෙවීමකට හෝ වගකීමකට නාවික හමුදාව බැඳී නොමැත.

8. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා:*

තෝරාගනු ලබන අයදුම්කරුවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා රෙගුලාසි පිළිපැදිය යුතුවේ.

9. වැටුප් හා දීමනා (පුහුණුව ලබන කාල සීමාවේ දී) :

2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| විස්තරය | ශිෂ්‍යභට නිලධාරි (රු.) | මධ්‍ය නිලධාරි (රු.) |
|---|---|---|
| මූලික වැටුප | 32,380.00 | 32,750.00 |
| ජීවන වියදම් දීමනාව | 7,800.00 | 7,800.00 |
| නිළ ඇඳුම් දීමනාව | 525.00 | 525.00 |
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 |
| එකතුව | 44,705.00 | 45,075.00 |

10. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමි වන පහසුකම්, දීමනා සහ වරප්‍රසාද :

අ. බඳවා ගනු ලබන අයදුම්කරුවන් හට ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උපාධි පාඨමාලාවන් හෝ දේශීය/ විදේශීය උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව හිමිවනු ඇත.

ආ. බඳවා ගනු ලබන අයදුම්කරුවන් හට ආහාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.

ඇ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට, කාලත්‍රයාට,දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඈ. කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරී නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ. (නාවික හමුදා බස්රථ සේවා ක්‍රියාත්මක නොවන ප්‍රදේශ සඳහා).

ඉ. නිළ ඇඳුම් සහ ඊට අදාළ විෂයන් නොමිලයේ සපයනු ලැබේ.

ඊ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට,කාලත්‍රයාට,දරුවන්ට සහ යැපෙන්නන්ට).

උ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරින්ට රු.3,200.00 සිට රු.7,700.00 දක්වා ගෙවල් කුළී දීමනාවක් හිමි වේ.

ඌ. ආහාරයෙන් බැහැර නිලධාරින් සඳහා ආහාර දීමනාවක් හිමිවේ.

එ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු. 637.50 ක් ගෙවනු ලැබේ.

11. *අයදුම්කරුවන්ට උපදෙස්* :

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙ හි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිළි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් **2022 නොවැම්බර් මස 28 වන දින දහවල් 1200ට** ප්‍රථම ලැබෙනසේ ''ජොෂ්ඨ මාණ්ඩලික නිලධාරි(බඳවාගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ 01'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ.ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ '**කැඩෙට් නිලධාරී තනතුර**' යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක **011-7195120 / 011-7195154** මගින් ලබා ගත හැක.

ආ. ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව දැනුම්දීමක් සිදු කරනු නොලැබේ. තැපැලේ දී යම් අයදුම්පත්‍රයක් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බවට දැනුම්දීමක් සිදු කරනු නොලැබේ.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අයදුම්කරුවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතුය.

(1) උප්පැන්න සහතිකය.
(2) අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන සහතික.
(3) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය.
(4) මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(6). මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් විය යුතුය).
(7). ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඇ. නියම කරන ලද අවස්ථාවන් හිදී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය. එසේ අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

12. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අයදුම්කරු තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

13. **බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය;**

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ. මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරණු ලබයි.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා;

| *ඉසව්ව* | *වාර ගණන* | *කාලය* |
|---|---|---|
| මීටර් 1600 දිවීම | - | මිනිත්තු 06- 08 අතර |
| Push up | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Sit ups / Curl ups | 25 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Arm bending | 05 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Standing board jump | 242 සෙ.මී.හෝ ඊට වැඩි | - |
| Rope climbing | - | - |
| Shuttle run | - | තත්පර 11 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් එදින ම පළමු සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන අතර, එයින් සමත් වන අයදුම්කරුවන් පමණක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන අතර එම පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් බඳවාගනු ලැබේ.

ඈ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ඉ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඊ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය Whatsapp / Email පණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගීවීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

උ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුණුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

ඌ. අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සහ කිරීම, එම අයදුම්කරු නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

එ. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

ඒ. සියලුම අයදුම්කරුවන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

14. ශ්‍රී ලංකා නාවික හමුදාවට කැඩෙට් නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතු වන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතුවේ.

***සටහන*** - මෙම *ගැසට්* නිවේදනය සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන් ම පළවේ. සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

ඩීඑන්එස් උළුගේතැන්න, ආර්එස්පී*, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ පෙ 593,
කොළඹ 01.

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ කැඩෙට් නිලධාරි සඳහා ඉල්ලුම්පත

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. ඉල්ලුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. විද්‍යුත් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. වයස ඃ අවුරුදු ඃ . . . . . . ., මාස ඃ . . . . . ., දින ඃ . . . . . (2022 නොවැම්බර් මස 28 වැනි දිනට)

10. උස ඃ . . . . . . . (අඟල්) පපුව ඃ . . . . . . . (අඟල්) බර ඃ . . . . . . (කි්. ගෟ.)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

15. දුරකතන අංකය/Whatsapp අංකය :————.

16. විවාහක හෝ අවිවාහක බව :————.

17. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් පිළිබඳ විස්තර ඃ

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ. පො. ස. (සා. පෙළ)<br>අ. පො. ස. (උ. පෙළ)<br>වෙනත් | | |

19. පාසලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර ඃ

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

21. ඉල්ලුම් කරන අංශය සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න.) :————.

24. සන්නද්ධ සේවා/ස්වේච්ඡා බල සේනාවේ/ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :————.

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේ ද? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

27. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

28. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළවන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-95

---

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව**

**ආධුනික ශිෂ්‍යභට නිලධාරි සහ ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි පුරප්පාඩු**

1. ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ පහත සඳහන් ශාඛාවල ආධුනික ශිෂ්‍යභට නිලධාරී (පිරිමි / කාන්තා) සඳහා පුරප්පාඩු පවතී.

   *අ.* නියමු පොදු රාජකාරි ශාඛාව (පිරිමි)
   *ආ.* ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු ශාඛාව (පිරිමි / කාන්තා)
   *ඇ.* සැපයුම් ශාඛාව (පිරිමි / කාන්තා)
   *ඈ.* පරිපාලන ශාඛාව (පිරිමි / කාන්තා)
   *ඉ.* රෙජිමේන්තු ශාඛාව (පිරිමි / කාන්තා)
   *ඊ.* මෙහෙයුම් ගුවන් ශාඛාව (ගුවන් ගමන් පාලක) (පිරිමි)
   *උ.* විනයාරක්ෂක ශාඛාව (පිරිමි)
   *ඌ.* තොරතුරු තාක්ෂණ ඉංජිනේරු (පිරිමි)

2. පහත සඳහන් සුදුසුකම් ඇති (පිරිමි / කාන්තා) අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

3. විශේෂ සුදුසුකම් (උපාධි වැඩසටහන) BSc (Aviation Studies) උපාධි වැඩ සටහන යටතේ ඇතුළත්වීමේ සුදුසුකම් (ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් පිළිගත්). උපාධි සහිත වැඩසටහන සඳහා අයදුම් කිරීමට අපේක්ෂිත

අයදුම්කරුවන් තම අයදුම් පත්‍රයේ අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල සඳහන් කිරීමේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන වග ද සඳහන් කළ යුතුය.

අ. **නියමු පොදු රාජකාරි / මෙහෙයුම් ගුවන් (ගුවන් ගමන් පාලක) ශාඛාවන්**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු අතර (අතිරේක සහ වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාව / ජීව විද්‍යා විෂය ධාරාව (භෞතික විද්‍යාව අනිවාර්ය විෂයයක් ලෙස) එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

ආ. **ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු ශාඛාව**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිත ව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු අතර (අතිරේක සහ වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා සංයුක්ත ගණිතය) එක් වරක දී අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථය සහ එක් විෂයයක් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා සිටිය යුතුයි.

ඇ. **සැපයුම් / පරිපාලන / රෙජිමේන්තු / විනයාරක්ෂක ශාඛාවන්**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු අතර (අතිරේක සහ වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් භෞතික /ජීව විද්‍යා / වාණිජ්‍ය / තාක්ෂණවේදය / කලා යන විෂය ධාරාවන්ගෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි. (විනයාරක්ෂක ශාඛාව සඳහා අයදුම් කරන්නන්හට අඩි 05 අඟල් 08කට වඩා උසකින් යුක්තවීම සම්මුඛ පරීක්ෂණයේ දී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ)

ඈ. **තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව**

අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එක් වරක දී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත් ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථ ද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඉහළ සාමාර්ථයක් ලබා සිටිය යුතු අතර (අතිරේක සහ වෛකල්පිත විෂයයන් හැර) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් තොරතුරු හා සන්නිවේදනය විෂය ඇතුළත්ව තාක්ෂණය විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යාව විෂය ධාරාවන්ගෙන් එක් වරක දී අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

4. *විශේෂ සටහන්* :- ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගත් (Pearson / Edexcel - International Ordinary / Advance Level, GCSE, GCE, Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන බවට සනාථ කරනු ලබන අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

5 අනෙකුත් සුදුසුකම් :- අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන් ම සපුරාලිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| *(අ)* | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| *(ආ)* | වයස | : | 2022.12.04 දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 22ට නොවැඩි විය යුතුයි. |
| *(ඇ)* | උස | : | පිරිමි - සෙන්ටිමීටර් 167.5 (අඩි 5යි අඟල් 6කට නොඅඩු විය යුතුයි).<br>කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5යි අඟල් 4කට නොඅඩු විය යුතුයි. |

(ඈ) බර : පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26
කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර(කි. ග්‍රෑ.)}}{\text{උස(මී)}^{2}}$$

(ඉ) පපුව : (පිරිමි) අඟල් 32 ට නොඅඩු විය යුතුයි.

(ඊ) වර්ණ දෘෂ්ටිය : සීපී 2

(උ) දෘෂ්ටි තීක්ෂණත්වය : වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් /කාච රහිත)

(ඌ) සිවිල් තත්ත්වය : අපේක්ෂකයින් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේ දී සහ අධිකාරියට පත්කළ දින සිට වසරක් ගතවන තුරු විවාහවීමට අවසර දෙනු නොලැබේ.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ.

7. ඉහත සඳහන් 3 සහ 5 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම්වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති සහ විශේෂ කුසලතා නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

8. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති සුදුසුකම් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් / සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔහු / ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

9. **සේවා කොන්දේසි :-**

අ. අපේක්ෂකයින් අනෙකුත් නිලයන් හා සමානව මූලිකව නිත්‍ය සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති ශාඛාව අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව සාර්ථකව නිමවීමෙන් පසු ඔහු / ඇය ප්‍රථමයෙන් බඳවා ගනු ලැබූ නිලයෙන් වෙනස්ව නියමු නිලධාරි නිලයේ ස්ථිර අධිකාරියට පත් කරනු ලැබේ.

ආ. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සූදානමින් සිටිය යුතුයි.

ඇ. පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව පුද්ගලයන් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

ඈ. සෑම ආධුනිකයෙකුට ම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

ඉ. පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින්හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා භෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

ඊ. අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකුහට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු / ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු / ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

ඌ. මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 34 වෙනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

එ. තෙවන සහ පස්වන ඡේදයේ පරිදි සුදුසුකම් සපුරා ඇති අපේක්‍ෂකයින්, ඔවුන් අයදුම්කරන ලද අභිමතාර්ථ ශාඛාවන් තුන පදනම් කරගෙන මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැදීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් මූලික සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වීමෙන් අනතුරුව ගුවන් නියමුවන් සඳහා වන විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට කැඳවනු ලැබේ. තමන්ට පවතින යම් නිධන්ගත රෝගයක්, ආබාධයක් පිළිබඳ ඉතිහාසය සඟවන හෝ යම් රෝගයකට නියම කරන ලද ඖෂධ පිළිබඳ හෙළි නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

ඒ. වෛද්‍ය පරීක්ෂණය සමත්වන සියලුම ශාඛාවන්වල අයදුම්කරුවන් නිළධාරි ගුණාංග පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් නිළධාරි ගුණාංග පරීක්ෂණයෙන් සමත් වුවහොත් පියාසර යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉන් අනතුරුව අදාළ සහ අවශ්‍ය පරිදි අනුගත කිරීමේ වැඩසටහන (Familiarization Training) සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයන් වෙත කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණ වලින් සාර්ථකවන සියලුම අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ශාඛාව සඳහා වන අයදුම්කරුවන් සංඛ්‍යාව සහ අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා පොරොත්තු ලේඛනයට (Standby list) අයදුම්කරුවන් තෝරා ගැනීම කුසලතා ලැයිස්තුව අනුව සිදුකරන අතර සියළුම සම්මුඛ පරීක්ෂණ සහ සෙසු පරීක්ෂණ අවසානයේ අවසාන කුසලතා ලැයිස්තුව පිළියෙල කරනු ලැබේ.

ඔ. නියමු පොදු රාජකාරි ශාඛාවේ අයදුම්කරුවන්හට පමණක් ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණයට සහභාගීවීමෙන් පසු අසමත් වුවහොත් ඉදිරි සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඉවත්වීමට හෝ පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් ලබා දෙන වෙනත් ශාඛාවක් වෙත ඇතුළත්වීමට අවස්ථාවක් හිමිවන අතර ඒ සඳහා එම අදාළ ශාඛාව සඳහා සෘජුවම අයදුම්කරන ලද අයදුම්කරුවන්ගේ නිළධාරී ගුණාංග පරීක්ෂණය දක්වා ලබාගත් ලකුණු මත පදනම්ව අවස්ථාවක් හිමිවේ. ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණය අසමත් වන අයදුම්කරුවන්හට ඉදිරියේ දී නැවත නියමු පොදු රාජකාරී ශාඛාව සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වේ.

ඕ. පොරොත්තු ලේඛනයේ (Standby list) සිටින අයදුම්කරුවන් හට අවස්ථාව සලසාදීම සඳහා, අවසන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අනුයුක්ත වීම සඳහා වන අවසාන තීරණය අවසන් සම්මුඛ පරීක්ෂණයේ දී හෝ එය අවසන් වූ වහාම ප්‍රකාශයට පත් කල යුතුය. අවසන් සම්මුඛ පරීක්ෂණය සමත්ව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක්වීමට නොහැකි බව නොදන්වා අවසාන බඳවා ගැනීමට නොපැමිණෙන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කිසිදු ඉදිරි අයදුම් කිරීමක් සඳහා සලකනු නොලැබේ.

ක. දුර්වල හැකියාවන් සහිත සහ නිවැරදි ආකල්ප, හැදියාවන්, චර්යාරටා නොදරණ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

ග. අවිවාහක නිළධාරීන්, නිළධාරී නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. බැට්මන් සේවය සපයනු ලැබේ. අවිවාහක නිළධාරීන්ගේ ආහාර දීමනා හා බැට්මන් දීමනාව නිළධාරී නිවස්නයට ගෙවනු ලැබේ.

ච. විවාහක නිළධාරීන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදාල පරිදි අය කරනු ලැබේ.

ජ. සියලුම නිළධාරීන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

ට. සියලුම නිළධාරීන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

10. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා ඃ- තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

11. වැටුප් හා දීමනා ඃ

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරින්ගේ එක් එක් නිලයන් සඳහා වැටුප් පහත සඳහන් පරිදි වේ. තවද පහත දක්වා ඇති සියලුම ඒකාබද්ධ වැටුප් ශ්‍රේණියේ ආරම්භක පියවර බව සටහන් කල යුතුය.

| වර්ෂය / නිළය | 2022 (වාර්ෂිකව) රුපියල් |
|---|---|
| ඔෆිසර් කැඩෙට් | 388,560.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය) | 463,260.00 |
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | 502,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 571,380.00 - (30x16020) = 1,051,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 667,500.00 - (24x16020) = 1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 731,580.00 - (22x16020) = 1,084,020.00 |
| විංග් කමාන්ඩර් | 751,140.00 - (17x19560) = 1,083,660.00 |

ආ. අනෙකුත් දීමනා

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.

(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කල පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.

(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 20.00 ක් ගෙවනු ලැබේ)

(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 100.00 ක් ගෙවනු ලැබේ)

(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.

(7) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව- එයාර් කොමොඩෝර් නිළයේ සිට ඉහල නිළයන් සඳහා මසකට රු. 600.00 ක් ද ගෘෘප් කැප්ටන් නිළයේ සිට පහල නිළයන් සඳහා මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.

(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා)

(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (කඳවුරෙන් පිටත වාසය කිරීමට අවසර ලැබුවන් සඳහා දිනකට රු. 774.37 ක් ගෙවනු ලැබේ. )

(10) සුදුසුකම් වේතනය අදාල පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.

(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරින් හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඊට ඉහළ නිළයන් සඳහා මසකට - රු.3,200.00 සිට රු.8,500.00 දක්වා.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිළය සිට එයාර් වයිස් මාර්ෂල් නිළය දක්වා මසකට රු.2,500.00 සිට රු. 5,000.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කල හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට /බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුල වාසය කරන නිලධාරින්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදාල පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරින්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) පියාසර දීමනාව නියමු පොදු රාජකාරි ශාඛාව සඳහා ගෙවනු ලැබේ.

(19) ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිළධාරීන් හට පමණි)

(20) විශේෂ අතුරු දීමනාව මසකට රු. 5000.00 ක් ගෙවනු ලැබේ.

12. විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා :- විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියළුම නිලධාරින් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

13. අයදුම්කරුවන්ට උපදෙස් ඃ-

අ, පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතේ සියලුම ඡේදයන් හැකි පමණ විස්තර හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කල යුතුයි. ඉල්ලුම්පත් 2022 දෙසැම්බර් මස 04 වන දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ ආධුනිකයින් බඳවා ගැනීමේ විධායක නිළධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපැලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉලලුම්පත් බහාලන කවරයේ ඉහළ "ආධුනික ශිෂ්‍යභට නිලධාරි / ආධුනික කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත්" යනුවෙන් සදහන් කල යුතුයි. එක් අයදුම්කරුවෙක්ට එක් අයදුම්පතක් තුලින් තමාගේ කැමැත්ත සහ සුදුසුකම් අනුව ශාඛාවන් තුනක් සඳහා ඉල්ලුම්කල හැකි අතර අයදුම්කර ඇති ශාඛා තුනෙන් කුමන ශාඛාවක් සඳහා හෝ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අවසන් තීරණය ගුවන් හමුදාධිපතිතුමා සතුවේ. අයදුම් කරන ශාඛාවන්ගෙන් මූලික සුදුසුකම් වඩාත් ම සපුරාලන එක් ශාඛාවට පමණක් මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ. තවද කැඳවීම් කරනු ලබන ශාඛාවෙ හි පරීක්ෂණයන්ගෙන් අසමත්වුවහොත් සහ එම ශාඛාවන් සඳහා පුරප්පාඩු තිබේනම් පමණක් අයදුම් කරන අනෙක් ශාඛාවන් දෙක සඳහා සම්මුඛ පරීක්ෂණයන් වෙත කැඳවීම ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය මත සිදුවේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් භාර ගනු නොලැබේ.

ආ. රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල /සිවිල් ආයතනයන් හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කල හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තුවේ / සංස්ථාවේ / මණ්ඩලයේ / ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍ර www.slaf.lk යන වෙබ් අඩවියෙන් බාගත කල හැක.

ඈ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමඟ සහතික කරනලද ඡායාපිටපත් ඉදිරිපත් කල යුතුය.

(1) උප්පැන්න සහතිකය (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කල සහතිකය වලංගු නොවේ).

(2) ජාතික හැඳුනුම්පත.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදාල අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත් වල

මුල්පිටපත් හා එහි ඡායාපිටපත බැගින් (විභාග දෙපාර්තුමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතුය)

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකවල මුල්පිටපත්.

(5) මාස 06ක් ඇතුලත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත්.

(7) මාස හයක් (6) ඇතුලත ලබාගන්නා ලද ග්‍රාම නිළධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය.

(9) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(10) අඟල් 2x2 ½ ප්‍රමාණයේ ග්‍රාමනිළධාරී විසින් සහතික කරන ලද වර්ණ ඡායා රූප දෙකක්.

ඉ, නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

ඊ. කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයඳුම්පත් සමඟ නොඑවිය යුතුය.

උ. අයදුම්පත සමඟ සහතික වල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

ඌ. අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපු වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්තමත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වලදී ඉවත් කරනු ලැබේ.

14. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක් කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙලිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමිවීමටද, තෝරා ගනු ලැබීමෙන් පසු හෙලිදරව් වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වේ.

15. තෝරාගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය :-

අ. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම් වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන් ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

ආ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ඇ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු / ඇය විසින් ඉදිරිපත් කල යුතුය.

ඈ. තෝරාගැනීමේ පරීක්ෂණයන් අතරතුර සියළු අයදුම්කරුවන් හට ලිඛිත, ප්‍රායෝගික හා නිළධාරී තත්ව පරීක්ෂණයන් සඳහා පෙනී සිටීමට සිදුවේ.

ඉ. අපේක්‍ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කල යුත්තේ ඔහුට / ඇයට සහතිකයක් දීමෙනි. අපේක්‍ෂකයකු තෝරාගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙලඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්‍ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවන්නේය.

ඊ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(එස් කේ පතිරණ)
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්), ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී,
යූඑස්පී, එම්එස්සී (එම්ඕඒ) යූඑස්ඒ, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා), එන්ඩීසී (ඉන්දියා), පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

ගුවන් හමුදාධිපති
මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594,
කොළඹ-02

| *කාර්යාලීය ප්‍රයෝජනය සඳහා* |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ආධුනික ශිෂ්‍යභට නිලධාරි/කාන්තා ශිෂ්‍යභට නිලධාරි සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදාවේ . . . . . . . . . . ශාඛාව**

ඉල්ලුම් කරන ශාඛාවන්

| | | |
|---|---|---|
| 1. | 2. | 3. |

1. පුරවැසිභාවය :————.

   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. තැපැල් ලිපිනය :————.

6. උපන් දිනය :————.
   වයස : (2022.12.04 වන දිනට) අවුරුදු :————. මාස :————. දින :————.

7. උස : සෙන්ටිමීටර් :———. (අඩි :———. අඟල් :———.)

8. පපුව : අඟල් :————.

9. බර : කිලෝග්‍රෑම් :————.

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

11. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

15. දුරකථන අංක :————. WhatsApp අංක :————. විද්‍යුත් ලිපිනය :————.

16. විවාහක හෝ අවිවාහක බව :————.

17. ස්ත්‍රී පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල : ප්‍රාථමික :————.
ද්විතීක :————.

19. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* (විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉල්ලුම්පත් යැවීමට සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐ | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| | *විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම්* | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

21. පාසලෙන්/විශ්ව විද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

22. මවුපියන් පිළිබඳ විස්තර ඃ

| *සම්පූර්ණ නම* | *ජා.හැ.ප. අංකය* | *රැකියාව* | | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|---|
| | | *පෙර* | *දැනට* | |
| පියා ඃ- | | | | |
| මව ඃ- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ ඃ | | | | |
| | | | | |
| | | | | |

23. ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ කලින් ගුවන් හමුදා සේවයක් වේනම් ඒ පිළිබඳව විස්තර ඃ

| නිලය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

24. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා) :————.

| අනු අංක | විස්තරය | පාසල් | පළාත් | ජාතික | අන්තර්ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

25. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

26. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

27. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

28. මීට පෙර ගුවන් හමුද චීන වරාය කඳවුරෙහි පැවැත්වෙන ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණයට සහභාගී වී තිබේද / නැද්ද යන වග සඳහන් කරන්න. :————.

29. එසේ ගුවන් නියමු යෝග්‍යතා පරීක්ෂණයට සහභාගී වුවානම් සහභාගී වූ වර්ෂය, මාසය හා ප්‍රතිඵලය සඳහන් කරන්න.

අ. වර්ෂය :————. මාසය :————.
ආ. ප්‍රතිඵලය ඃ සමත්/අසමත්

30. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

31. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුලුව) සේවයෙ හි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

32. **චරිත සහතික පිළිබඳ විස්තර :**

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |
| | | |

33. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

__________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :__________.

34. ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ

(*අ*) ඉහත අයදුම්පතේ 33 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ……………………...................................... නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිලයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

__________,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :__________.

නම :________________________________________.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :________________________________________.

__________,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය :__________.

නම :________________________________________.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :__________.

__________,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය :__________.

නම :________________________________________.

(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :________________________________________.

11-94/1

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව නිලධාරි පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත ශාඛාවන් සඳහා (නිත්‍ය / ස්වේච්ඡා) නිලධාරීන් ලෙස අධිකාරියට පත්කොට බඳවා ගැනීමට සුදුසු පිරිමි / කාන්තා අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී.

   අ. ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු (පිරිමි).
   ආ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු (පිරිමි/කාන්තා).
   ඇ. තොරතුරු තාක්ෂණ ඉංජිනේරු (පිරිමි/කාන්තා).
   ඈ. සැපයුම් (පිරිමි).
   ඉ. සිවිල් ඉංජිනේරු (පිරිමි).
   ඊ. වෛද්‍ය (පිරිමි/කාන්තා).
   උ. දන්ත වෛද්‍ය (පිරිමි/කාන්තා).
   ඌ. නීති (පිරිමි).
   එ. පශු වෛද්‍ය (පිරිමි/කාන්තා).
   ඒ. අධ්‍යාපන (පිරිමි/කාන්තා).
   ඔ. විගණන (පිරිමි).

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි / කාන්තා අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

   අ. **වෘත්තීය / ශාස්ත්‍රීය සුදුසුකම්**

   (1) **ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු ශාඛාව**

   (අ) ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු නිලධාරි (රසායනික ඉංජිනේරු) - පිරිමි (ස්වේච්ඡා)
   රසායනික විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධිය (ගෞරව) ලබා තිබීම රසායනික ද්‍රව්‍ය සමග මතුපිට පිරියම් හෝ ඒ හා සමාන ක්ෂේත්‍රයක වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

   (ආ) ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු නිලධාරි (පර්යේෂණ විද්‍යාඥයින් - ගුවන්යානා ) - පිරිමි (ස්වේච්ඡා)
   ගුවන්යානා ඉංජිනේරු විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධිය (ගෞරව) ලබා තිබීම.

   අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵලවලින් ඉහළ ශ්‍රේණිගත අගයක් ලබා තිබීම, දේශීය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම, අවසන් වසරේ නවීන ආකාරයේ ව්‍යාපෘතියක් නිමවා තිබීම සහ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පුහුණුවක් ලබා ඇති අයවලුන්ට ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබේ.

   (ඇ) ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු නිලධාරි (පර්යේෂණ විද්‍යාඥයින් - Mechatronics ) - පිරිමි (ස්වේච්ඡා)
   යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී උපාධිය (ගෞරව) Mechatronics පිළිබඳ විශේෂඥතාවය.

   අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵලවලින් ඉහල ශ්‍රේණිගත අගයක් ලබා තිබීම, දේශීය විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම, අවසන් වසරේ නවීන ආකාරයේ ව්‍යාපෘතියක් නිමවා තිබීම සහ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පුහුණුවක් ලබා ඇති අයවලුන්ට ප්‍රමුඛස්ථානයක් දෙනු ලැබේ.

   (2) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු ශාඛාව

   (අ) **පර්යේෂණ නිලධාරි - පිරිමි/ කාන්තා (ස්වේච්ඡා)**

   i. ගෲප් කැප්ටන්/ විංග් කමාන්ඩර්
   මහාචාර්ය/ ආචාර්ය මට්ටමේ සුදුසුකම් ලත් වෘත්තිකයින් විය යුතු අතර, ඉංජිනේරු භෞතික විද්‍යාව/ නැනෝ තාක්ෂණවේදය/ රොබෝ තාක්ෂණවේදය සහ යාන්ත්‍ර ඉංජිනේරු හෝ එයට සමගාමී ක්ෂේත්‍රයක අවම වශයෙන් අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයකින් දර්ශන ආචාර්ය මට්ටම (PhD) සම්පූර්ණ කර තිබීම.

   බඳවා ගන්නා නිලධාරින් ප්‍රධාන වශයෙන් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල රාජකාරි සඳහා යොදවනු ලැබේ.

ii. **ස්කොඩ්‍රන් ලීඩර්**
ශාස්ත්‍රපති උපාධිධාරී මට්ටමේ සුදුසුකම් ලත් වෘත්තිකයින් විය යුතු අතර, පහත සඳහන් ක්ෂේත්‍රයන්හි හෝ එයට සමගාමී ලෙස අවම වශයෙන් අවුරුද්දක පළපුරුද්දක් තිබීම හා අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ශාස්ත්‍රපති උපාධි මට්ටම සම්පූර්ණ කර තිබීම.

- විදුලි/ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු
- රසායනික/ජීව විද්‍යා ඉංජිනේරු
- දුරස්ථ සංවේදන
- යාන්ත්‍රික හා යාන්ත්‍රික ඉංජිනේරු
- සයිබර් ආරක්ෂණ/ජාල ඉංජිනේරු
- නැනෝ තාක්ෂණවේදය
- තාක්ෂණික මෙවලම්

බඳවා ගන්නා නිලධාරීන් ප්‍රධාන වශයෙන් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල රාජකාරි සඳහා යොදවනු ලැබේ.

(ආ) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු නිලධාරි - පිරිමි (නිත්‍ය)

පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධියක් හෝ භෞතික විද්‍යාව උපාධියක් සමග ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ ප්‍රධාන විෂයක් ලෙස හෝ විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමාවක් (NDT) ලබා තිබීම හෝ මොරටුව විශ්වවිද්‍යාලයෙන් හෝ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය මගින් පිරිනමන ලද ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDT) හෝ තාක්‍ෂණ ඉංජිනේරු ආයතනය මගින් පිරිනමන ලද ඉලෙක්ට්‍රොනික/සංනිවේදනය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම සහ IESL ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) **තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාව**

(අ) *ජාල කළමනාකාර නිලධාරීන් - පිරිමි (නිත්‍ය)*
පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආශ්‍රිත විෂය ධාරාවන් යටතේ ඉංජිනේරු උපාධිය හෝ පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත විෂය ධාරාවලින් උපාධිය හෝ ප්‍රධාන විෂයක් ලෙස පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව යන විෂයයක් ඇතුළත් භෞතික විද්‍යාවේදී උපාධි හෝ තොරතුරු තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමා හෝ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (HNDIT) හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය හෝ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජිකත්වය (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සංගමයේ සාමාජිකත්වය (ACS) හෝ සමාන විශේෂකරණ සුදුසුකම් තිබීම දත්ත සන්නිවේදනය /දත්ත ජාලකරණය හෝ සේවාදායක පද්ධති (Server systems) පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ආ) *මෘදුකාංග ක්‍රම ලේඛක නිලධාරීන් - පිරිමි (නිත්‍ය)*
පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආශ්‍රිත විෂය ධාරාවන් යටතේ ඉංජිනේරු උපාධිය හෝ පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත විෂය ධාරාවලින් උපාධිය හෝ ප්‍රධාන විෂයක් ලෙස පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව යන විෂයක් ඇතුළත් භෞතික විද්‍යාවේදී උපාධි හෝ තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (HNDIT) හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ (ACS) හෝ මෘදුකාංග සංවර්ධන කුසලතා පිළිබඳ පළපුරුද්ද හෝ Java, C# or C/C++, enterprise technologies (such as Web services, APIs, XML, JSON, SSO, JMS) ,cloud technologies and container technologies (AWS, Azure and Docker), micro services, enterprise interprise API management පිළිබඳ නිපුණතාවය සහ අත්දැකීම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඇ) *තොරතුරු / වෙබ් අවකාශ ආරක්ෂක විශේෂඥයින් - පිරිමි (නිත්‍ය)*
පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආශ්‍රිත විෂය ධාරාවන් යටතේ ඉංජිනේරු උපාධිය හෝ පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත විෂය ධාරාවලින් උපාධිය හෝ ප්‍රධාන විෂයක් ලෙස පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව යන විෂයයක් ඇතුළත් භෞතික විද්‍යාවේදී උපාධි හෝ තොරතුරු තාක්ෂණ උසස් ජාතික ඩිප්ලෝමා (HNDIT) හෝ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය හෝ බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) සාමාජිකත්වය හෝ

ඕස්ට්‍රේලියානු පරිගණක සංගමයේ (ACS) සාමාජිකත්වය හෝ සමාන විශේෂකරණ සුදුසුකම් සහිත තොරතුරු සයිබර් ආරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ නිපුණතාවය සහ අත්දැකීම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඈ) වෙබ් අඩවි නිර්මාණකරුවන් - පිරිමි (නිත්‍ය)

පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආශ්‍රිත විෂය ධාරාවන් යටතේ ඉංජිනේරු උපාධිය හෝ පරිගණක තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත විෂය ධාරාවලින් උපාධිය හෝ ප්‍රධාන විෂයක් ලෙස පරිගණක විද්‍යාව තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව යන විෂයයක් ඇතුළත් භෞතික විද්‍යාවේදී උපාධි හෝ තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (HNDIT) හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ (ACS) හෝ HTML/XHTML/HTML5,CSS3(Cascade Style Sheet), React JS, Angular JS, Ajax JavaScript, J Query, PHP, MySQL,ASP.NET,MSSQL පිළිබඳ විශේෂඥ දැනුම සහ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඉ) *තොරතුරු තාක්ෂණ පද්ධති විශ්ලේෂක (IT Systems Analyst) - පිරිමි/කාන්තා (නිත්‍ය/ස්වේච්ඡා)*

ඉංජිනේරු උපාධිය (පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය ඉලෙක්ට්‍රොනික විද්‍යාව) හෝ පරිගණකවේදී උපාධිය, තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධිය හෝ භෞතික විද්‍යාව පිළිබඳ උපාධිය, පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (HNDIT) හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකත්වය හෝ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජිකත්වය (BCS) හෝ ඕස්ට්‍රේලියානු පරිගණක සමාජයේ සාමාජිකත්වය (ACS) තොරතුරු තාක්ෂණ පද්ධති විශ්ලේෂණය කිරීම, තොරතුරු තාක්ෂණ අවශ්‍යතා රැස්කිරීම සහ ඉදිරිපත් කිරීම සහ නව තාක්ෂණ පද්ධති ගොඩනැගීම පිළිබඳ නිපුණතාවය සහ අත්දැකීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(4) **සැපයුම් ශාඛාව**

(අ) *භෝජනාගාර කළමනාකරු - පිරිමි (නිත්‍ය)*

හෝටල් කළමනාකරණය පිළිබඳව උපාධියක් හෝ උසස් ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම හෝ දේශීය/විදේශීය පිළිගත් ආයතනයක විෂය පිළිබඳ වෘත්තීය පුහුණුවක් සමග කාණ්ඩ 4 කින් සමන්විත පූර්ණකාලීන මූලික පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ මධ්‍යම සහ උසස් මට්ටමේ සූපශාස්ත්‍රය පිළිබඳව වෘත්තීමය පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සමග තරු පංති හෝටලයක සූපශාස්ත්‍රය පිළිබඳව විධායක තත්ත්වයේ වසර තුනක (03) වෘත්තීමය මට්ටමේ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ආ) *ඇගළුම් තාක්‍ෂණික නිලධාරි - පිරිමි (නිත්‍ය)*

තාක්‍ෂණික හෝ ඉංජිනේරු විද්‍යාව සඳහා වූ විද්‍යාවේදී උපාධිය ලබා තිබීම ඇගළුම් සහ රෙදිපිළි තාක්‍ෂණය සඳහා වූ පශ්චාත් උපාධිය ලබා තිබීම හෝ ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇගළුම් පිළිබඳ වෙනත් පිලිගත් ආයතනයකින් රෙදිපිලි හා ඇගළුම් පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(5) **සිවිල් ඉංජිනේරු ශාඛාව**

(ආ) *සිවිල්/ කාර්මික ඉංජිනේරුවන් - පිරිමි (නිත්‍ය)*

සිවිල් / කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ සිවිල් / කාර්මික ඉංජිනේරු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) / ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) / උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

(6) **වෛද්‍ය ශාඛාව**

(අ) ශල්‍ය වෛද්‍ය විශේෂඥ- පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ශල්‍ය වෛද්‍ය විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD - General Surgery) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර ශල්‍ය වෛද්‍ය විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(ආ) නිර්වින්දන විශේෂඥ- පිරිමි / කාන්තා (ස්වේච්ඡා)
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් නිර්වින්දන විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD - Anesthesiology) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර නිර්වින්දන විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(ඇ) ළමා රෝග විශේෂඥ- පිරිමි / කාන්තා (ස්වේච්ඡා)
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ළමා රෝග විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD - Pediatric) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර ළමා රෝග විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(ඈ) ප්‍රසව හා නාරිවේද විශේෂඥ- පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගත් ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය විද්‍යාව (MD - Obstetrician and Gynecology) පිළිබඳ වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතු අතර ප්‍රසව හා නාරිවේද විශේෂඥවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

විශේෂ සටහනඃ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා 2023 අප්‍රේල් මස 30 වන දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි, නමුත් වයස අවුරුදු 40 ට වැඩි විශේෂඥ වෛද්‍යවරුන් විශේෂ නිපුණතාවයක් /දක්ෂතාවයක් හා පලපුරුද්දක් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය පරිදි (විංග් කමාණ්ඩර් නිලය සඳහා) ඔහු/ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

(7) දන්ත වෛද්‍ය අංශය

(අ) දන්ත වෛද්‍ය නිලධාරී - පිරිමි / කාන්තා (නිත්‍ය /ස්වේච්ඡා)
දන්ත වෛද්‍ය (බී.ඩී.එස්) (ශ්‍රී ලංකා) උපාධිය හෝ ඒ හා සමාන ඕනෑම පිළිගත් විදේශීය විශ්ව විද්‍යාලයකින් (බී.ඩී.එස්) උපාධියක් සපුරා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථිරව ලියාපදිංචි වී තිබිය යුතුය.

(ආ) පූර්ව සීමාවාසික දන්ත වෛද්‍ය උපාධිලාභීන් - පිරිමි / කාන්තා (නිත්‍ය /ස්වේච්ඡා )
දන්ත වෛද්‍ය සිසුන් බී.ඩී.එස්. (BDS) (ශ්‍රී ලංකා) විශ්වවිද්‍යාල වර්ෂාර්ධය (Semester) 07-08 වන අධ්‍යයන වාරයේ (4 වන වසරට සමාන) ඉගෙනුම ලබන සිසුන් හෝ 08 වන අධ්‍යයන වාරය සම්පූර්ණ කරන ලද (05 වන වසරට සමාන) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගෙන ඇති සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ තාවකාලික ලියාපදිංචිය සම්පූර්ණ කර නොමැති විදේශීය රටක පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් බී.ඩී.එස්. (BDS) උපාධියක් හෝ සමාන සුදුසුකම් සලකා බලනු ලැබේ, විදේශීය දන්ත වෛද්‍ය උපාධිධාරී අපේක්ෂකයින් බඳවාගත් දින සිට වසර පහක් (5) ඇතුළත ERPDS විභාගය සමත්වීම සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමඟ ස්ථිර ලියාපදිංචිය ලබාගත යුතුය,

(8) **නීති ශාඛාව**

(අ) නීති නිලධාරි - පිරිමි (නිත්‍ය)
ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම සහ

i. නීතිඥවරයෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (3) කාලයක් මහේස්ත්‍රාත් අධිකරණයේ, දිසා අධිකරණයේ, මහාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණය තුළ නඩු කටයුතු මෙහෙයවා තිබීම,
ii. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් වාණිජ ගිවිසුම් සැකසීම පිළිබඳ පලපුරුද්ද, නොතාරිස් කටයුතු පිළිබඳ ලේඛන සැකසීම,
iii. අවබෝධතා ගිවිසුම් සහ මිලදී ගැනීමේ ලේඛන සැකසීම පිළිබඳ පලපුරුද්ද තිබිය යුතුය.
iv. ඉංග්‍රීසි භාෂාව සහ පරිගණක යතුරු ලිවීම අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

(9) **පශු වෛද්‍ය ශාඛාව**

(අ) පශු වෛද්‍ය නිලධාරි - පිරිමි / කාන්තා (නිත්‍ය /ස්වේච්ඡා)
පශු වෛද්‍ය විද්‍යාව සහ සත්ව විද්‍යාව පිළිබඳ උපාධියක් (BVSc) ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ (SLVC) ලියාපදිංචි වී තිබීම. මාස 06 සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීමට යටත් ව ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ (SLVC) ලියාපදිංචිය

අපේක්ෂිත පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිධාරීන් ද සලකා බලනු ලැබේ, රැකියා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

(10) අධ්‍යාපන ශාඛාව

(අ) ඉංග්‍රීසි භාෂා උපදේශක - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)

පිළිගත් විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි උපාධිය තිබීම හෝ අධ්‍යාපනවේදී ඉංග්‍රීසි ගුරු උපාධිය හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා ඉංග්‍රීසි භාෂාව TESL/TEFL/TESOL හෝ ශාස්ත්‍රපති උපාධිය ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යය හෝ ශාස්ත්‍රපති උපාධිය TESL/TESOL/TEFL හදාරා තිබීම.

*හෝ*

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක වසර තුනක (03) (පස්දුන්රට) ඉංග්‍රීසි භාෂා ගුරුවරයෙකු ලෙස ගුරු පුහුණු ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ලෙස හදාරා තිබීම හෝ රජයේ ඉංග්‍රීසි ගුරු අභ්‍යාස විද්‍යාලයක වසර දෙකක (02) ඉංග්‍රීසි ගුරු පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ CELTA/DELTA යන කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය යටතේ පාඨමාලා බ්‍රිටිෂ් කවුන්සිලයෙහි සාර්ථකව නිම කර තිබීම

පිළිගත් අධ්‍යාපන ආයතනයක වසර 02ක ඉගැන්වීමේ පළපුරුද්ද අනිවාර්‍යයෙන් තිබිය යුතුය.

(ආ) ප්‍රංශ සහ චීන භාෂා උපදේශකයන් - පිරිමි / කාන්තා (ස්වේච්ඡා)
ප්‍රංශ / චීන භාෂාව පිළිබඳ වසරක (01) ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණකර තිබීම සහ රජයේ හෝ රජය විසින් පිළිගත් ආයතනයක වසර තුනක (03) ප්‍රංශ / චීන භාෂා ගුරුවරයෙකු ලෙස සේවා පළපුරුද්දක් තිබීම.

(11) **විගණන ශාඛාව**

(අ) අභ්‍යන්තර විගණන නිළධාරී - පිරිමි (නිත්‍ය) - ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් වාණිජවේදී / කළමනාකරණ / ගණකාධිකරණ හෝ ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රයේ උපාධියක් සහ යම් කිසි ආයතනයක විගණන අංශයක හෝ විගණන නොවන අංශයක වසරක සේවා පළපුරුද්දක් පැවතීම සමග පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් හෝ කිහිපයක් පැවතීම.

i. ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරිවරයෙකු විය යුතුය. (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ පක්ෂාංගය) ;

හෝ

ii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයෙකු හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරන ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරන ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ කළමණාකරණ ගණකාධිකාරීවරයෙකු වීම.

හෝ

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරීවරයෙකු වීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම හෝ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

ආ. *පළපුරුද්ද* :- ඉහත සුදුසුකම් වලින් පසුව අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක (02) හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම තෝරාගැනීමේදී අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

ඇ. මූලික අධ්‍යාපන සුදුසුකම්

(1) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී අවම වශයෙන් සම්මාන 6 ක් සහිතව සමත්ව තිබිය යුතු අතර ඉන් ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථද සිංහල / දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක්ද ලබා සිටීම අනිවාර්ය වේ. (අතිරේක හා වෛකල්පිත විෂයයන් හැර) මෙහිදී කාර්මික වෘත්තීන් (ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු ශාඛාව, විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු සහ තොරතුරු තාක්ෂණ

ඉංජිනේරු ශාඛාව) සඳහා ඉඳුරාම බැඳීමට අපේක්ෂා කරන පශ්චාත් උපාධිය හෝ අවශ්‍යය මට්ටමට ඉහළ වෘත්තීය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා ඉල්ලුම් කරන මූලික අධ්‍යාපන ප්‍රවේශ සුදුසුකම් ලෙස ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම හෝ දෙවන වරට ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු ලැබේ.

(2) අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී ඕනෑම අංශයකින් අවම වශයෙන් විෂයයන් තුනකට සාමාන්‍ය සාමාර්ථ ලබා සිටිය යුතුයි.

(3) ජාත්‍යන්තර පාසල් වල අධ්‍යාපනය ලැබූ (Pearson / Edexcel - International Ordinary / Advance Level, GCSE, GCE, AS Level with appropriate Foundation Programme Cambridge exam qualification) සිසුන් සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඉහත දෙවන ඡේදයේ 'ඇ'(1) හා (2) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සමඟ සැසඳෙන බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

3. මූලික සුදුසුකම්ඃ-

අ. පුරවැසිභාවය :- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය

ආ. සිවිල් තත්ත්වය :- විවාහක / අවිවාහක

ඇ. ස්ත්‍රී පුරුෂ භාවය :- පිරිමි / කාන්තා (අදාල පරිදි)

ඈ. වයස :- 2022.12.04 වැනි දිනට

**පර්යේෂණ නිලධාරි**
ගෲප් කැප්ටන් /විංග් කමාන්ඩර් - අවුරුදු 50ට නොවැඩි විය යුතුය
ස්කොඩ්‍රන් ලීඩර් - අවුරුදු 40ට නොවැඩි විය යුතුය

**සියලූ සෙසු ශාඛාවන්**
අවුරුදු 18 සිට 33 දක්වා

ඉ. උස :-

**වෛද්‍ය /දන්ත වෛද්‍ය ශාඛාව**
පිරිමි - සෙන්ටිමීටර් 165 (අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය.
කාන්තා - සෙන්ටිමීටර් 160 (අඩි 5 යි අඟල් 3) ක් හෝ ඊට වැඩි විය යුතුය.

**පර්යේෂණ නිලධාරි**
පිරිමි - සෙන්ටිමීටර් 165 (අඩි 5 යි අඟල් 5) ක් හෝ ඊට වැඩි විය යුතුය.
කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5 යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුය.

**සියලූ සෙසු ශාඛාවන්**
පිරිමි - සෙන්ටිමීටර් 167.5 (අඩි 5 යි අඟල් 6) ක් හෝ ඊට වැඩි විය යුතුය.
කාන්තා - සෙන්ටිමීටර් 162.5 (අඩි 5 යි අඟල් 4) ක් හෝ ඊට වැඩි විය යුතුය.

ඊ. බර ඃ- පිරිමි 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26
කාන්තා 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$$

උ. පපුව :- අඟල් 32" ට නොඅඩු විය යුතුයි (පිරිමි)

ඌ. වර්ණ දෘෂ්ටිය :- සීපී2

එ. දෘෂ්ටි තීක්ෂණත්වය :- වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් / කාච රහිතව) (වෛද්‍ය /දන්ත වෛද්‍ය ශාඛාව අපේක්ෂකයින් උපැස් රහිතව ඇස්වල දෘෂ්ටි තීක්ෂණත්වය 6/18 තෙක් වන අයෙක් නම් එය උපැස් සහිතව 6/6 තත්වයට තිබීම අනිවාර්ය වේ).

4. විශේෂ සටහන්:-

අ. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කරනු ලැබේ. *ගැසට්* පත්‍රයේ ඉල්ලා ඇති මිනුම් වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් විශේෂ කුසලතාවක් නොමැති නම් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ.

ආ. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පලපුරුද්ද අනුව පර්යේෂණ නිළධාරීන්, වෘත්තීය / ශාස්ත්‍රීය සුදුසුකම්වල (02) (අ) හි සඳහන් ගෲප් කැප්ටන්/ විංග් කමාන්ඩර් / ස්කොඩ්‍රන් ලීඩර් නිළයන් සහ අනෙකුත් සෙසු අපේක්ෂකයින් ගුවන් හමුදාධිපතිගේ අභිමතය පරිදි ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් සහ පලපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් / ෆ්ලයින් ඔෆිසර් / ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යන නිළයන්හි අධිකාරියට පත් කරනු ලැබේ.

ඇ. තෝරා ගනු ලබන සියළුම අපේක්‍ෂකයින් හට ලිඛිත, ප්‍රායෝගික පරීක්ෂණයකට සහ නිලධාරි තත්ත්ව පරීක්ෂාව සඳහා පෙනී සිටීමට සිදුවේ.

ඈ. තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

ඉ. සියලුම මූලික ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධීන් සහ ඩිප්ලෝමාවන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට සනාථ කල යුතුය.

ඊ. යම් අයදුම්කරුවෙකු ඉහත දක්වා ඇති අවශ්‍යතාවයන් නියමිත පරිදි සපුරා නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් / දක්ෂතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අභිමතය පරිදි ඔහු / ඇය බඳවාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

උ. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ට දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

ඌ. රාජ්‍ය භාෂා අවශ්‍යතා :- තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නාවූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතුය.

එ. තෝරා ගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන ස්ථානයකදී පුහුණුවක් ලැබිය යුතුය. පුහුණුවන අවස්ථාවේදී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිළධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිළධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසි වලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට හෝ බැඳී සිටින්නේය.

ඒ. වෛද්‍ය පරීක්ෂණය සමත්වන සියලුම ශාඛාවන්වල අයදුම්කරුවන් නිළධාරි තත්ත්ව පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එහිදී සාර්ථකවන සියලුම අයදුම්කරුවන් අදාල සහ අවශ්‍ය පරිදි අනුගත කිරීමේ වැඩසටහන (Familiarization Training) සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයන් වෙත කැඳවනු ලැබේ. මෙම පරීක්ෂණ වලින් සාර්ථකවන සියළුම අයදුම්කරුවන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ශාඛාව සඳහා වන අයදුම්කරුවන් සංඛ්‍යාව සහ අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදානම් ලේඛනයට (standby list) අයදුම්කරුවන් තෝරා ගැනීම කුසලතා ලැයිස්තුව අනුව සිදුකරන අතර සියළුම සම්මුඛ පරීක්ෂණ සහ සෙසු පරීක්ෂණ අවසානයේ අවසාන කුසලතා ලැයිස්තුව පිළියෙල කරනු ලැබේ. තමන්ට පවතින යම් නිධන්ගත රෝගයක්, ආබාධයක් පිළිබඳ ඉතිහාසය සඟවන හෝ යම් රෝගයකට නියම කරන ලද ඖෂධ පිළිබඳ හෙළි නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

ඔ. 1951 අප්‍රේල් මස 27 වන දින අංක 10,240 දරණ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිළධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. ගුවන් හමුදා පනතේ 10 වන වගන්තිය අනුව "සෑම නිළධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක" කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිළධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ඇප / ගිවිසුම් බැදී ඇත්නම් පුහුණු කාලය සහ පාඨමාලාවන් හදාරන්නේනම් ඉහත සඳහන් පරිදි ගුවන් හමුදා පනතේ 11 වන වගන්තිය අනුව අස්වීමට නොහැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසි වලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

ඕ. සුදානම් ලේඛනයේ (standby list) සිටින අයදුම්කරුවන් හට අවස්ථාව සලසාදීම සඳහා, අවසන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වන අයදුම්කරුවන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අනුයුක්ත වීම සඳහා වන අවසාන තීරණය අවසන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ එය අවසන් වූ වහාම ප්‍රකාශයට පත් කල යුතුය. අවසන් සම්මුඛ පරීක්ෂණය සමත්ව, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක්වීමට නොහැකි බව නොදන්වා අවසාන බඳවා ගැනීමට නොපැමිණෙන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කිසිදු ඉදිරි අයදුම්කිරීමක් සඳහා සලකනු නොලැබේ.

ක. දුර්වල හැකියාවන් සහිත සහ නිවැරදි ආකල්ප, හැදියාවන්, චර්යාරටා නොදරණ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියෙන් ඕනෑම අවස්ථාවක ඉවත් කරනු ලැබේ.

ග. ගුවන් හමුදා නිළධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ කවර තැනකට වුවද යවනු ලැබීමට යටත් වේ.

ච. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිළධාරීන් පාලනය කරනු ලැබේ.

ජ. අවිවාහක නිළධාරීන්, නිළධාරි නිවස්නයේ වාසය කල යුතුය. ගෘහ භාණ්ඩ, නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට / ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවයද සපයනු ලැබේ. අවිවාහක නිළධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

ට. විවාහක නිළධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිළධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 5. ඇ. (11) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

5. වැටුප් හා දීමනාඃ-

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිළධාරීන්ගේ එක් එක් නිලයන් සඳහා වැටුප් පහත සඳහන් පරිදි වේ. තවද පහත දක්වා ඇති සියලුම ඒකාබද්ධ වැටුප් ශ්‍රේණියේ ආරම්භක පියවර බව සටහන් කල යුතුය.

| වසර / නිළය | 2022 (වාර්ෂිකව) |
|---|---|
| පයිලට් ඔෆිසර් (ශිෂ්‍ය නොවන) | 502,860.00 |
| ෆ්ලයින් ඔෆිසර් | 571,380.00 - (30x16020)=1,051,980.00 |
| ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් | 667,500.00 - (24x16020)= 1,051,980.00 |
| ස්කොඩ්‍රන් ලීඩර් | 731,580.00 - (22x16020)=1,084,020.00 |
| විංග් කමාන්ඩර් | 751,140.00 - (17x19560)=1,083,660.00 |
| ග්‍රෑප් කැප්ටන් | 914,100.00 - (17x26040)=1,356,780.00 |

ආ. වෛද්‍ය නිලධාරීන්ගේ වැටුප් :

| වසර / ශ්‍රේණිය | 2022 (වාර්ෂිකව) |
|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | 651,480.00 (2x16020-7x16140-2x19560-16x26040) = 1,252,260.00 |
| 2 වන ශ්‍රේණිය | 699,660.00 (6x16140-2x19560-16x26040) =1,252,260.00 |
| 1 වන ශ්‍රේණිය | 861,660.00 (15x26040)=1,252,260.00 |
| විශේෂ ශ්‍රේණිය | 1,056,000.00 (12x32400)=1,444,800.00 |

ඇ. අනෙකුත් දීමනා වෛද්‍ය ශාඛාවේ නිලධාරීන් සඳහා.

(1) විශ්‍රාම වැටුප් හිමි දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)
විශේෂ ශ්‍රේණිය - රු. 3,400.00 (මසකට)

(2) විශ්‍රාම වැටුප් රහිත දීමනා

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 2,125.00 (මසකට)
2 වන ශ්‍රේණිය - රු. 1,700.00 (මසකට)
1 වන ශ්‍රේණිය - රු. 400.00 (මසකට)

(3) විවේකකාල රාජකාරී බටා,
ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනාව - රු. 35,000.00 (මසකට)

(4) අතිරේක රාජකාරී දීමනාව

ප්‍රාථමික ශ්‍රේණිය - රු. 687.00 (පැයකට)
2 වන ශ්‍රේණිය - රු. 796.00 (පැයකට)
1 වන ශ්‍රේණිය - රු. 1,101.00 (පැයකට)
විශේෂ ශ්‍රේණිය - රු. 1,302.00 (පැයකට)

(5) 5. ඇ. (18) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාළ පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

ඇ. *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 7,800.00 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කල පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250.00 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 620.00 ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට අමතර දුෂ්කර දීමනා මසකට රු. 4,380.00 ක් ගෙවනු ලැබේ.
(5) විශේෂ දීමනාව මසකට රු. 3,100.00 ක් ගෙවනු ලැබේ.
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000.00 ගෙවනු ලැබේ.
(7) නිළ ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 525.00 ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(9) ආහාර දීමනාව මසකට රු. 24,005.47 ක් ගෙවනු ලැබේ. (දිනකට රු. 774.37 පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා)
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.
(11) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන් හට පහත සඳහන් පරිදි නිවාස කුළී දීමනාවක් හිමිවේ. පයිලට් ඔෆිසර් සිට ස්කොඩ්‍රන් ලීඩර් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට - රු. 3,200.00 සිට රු. 8,500.00 දක්වා.

(12) දුරකථන බිල් දීමනාව විංග් කමාන්ඩර් නිළය සිට එයාර් වයිස් මාර්ෂල් නිලය දක්වා මසකට රු. 2,500.00 සිට රු. 5,000.00 දක්වා ගාස්තුවක් ගෙවනු ලැබේ.

(13) නොමිලේ ගමන් කල හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට /බිරිඳ සහ දරුවන්ට) දෙනු ලැබේ.

(14) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(15) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.

(16) නොමිලේ වෛද්‍ය පහසුකම්. (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි)

(17) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.

(18) සේවා දීමනා මාසිකව රු. 300.00, රු. 400.00, රු. 500.00 සුදුසු පරිදි වේ. (සම්පූර්ණ කරන ලද සේවා කාලයන්ට අනුව වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(19) ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 ක් ගෙවනු ලැබේ. (ඉංජිනේරු ශාඛාවේ සුදුසුකම් ලත් නිලධාරීන් හට පමණි)

(20) වරලත් ඉංජිනේරු දීමනාව මසකට රු.15,000.00 සිට රු.30,000.00 දක්වා මාසිකව ගෙවනු ලැබේ (අදාළ වනුයේ සුදුසුකම්ලත් වරලත් ඉංජිනේරු නිලධාරීන් හට පමණි).

(21) අමතර සේවා දීමනා මසකට රු. 1,500.00 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(22) 1/20 දීමනාව මසකට - මූලික වැටුප x 1/20 x උපරිම දින 3 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(23) අමතර රාජකාරී ගෙවීම් මසකට - උපරිම පැය 120 (වෛද්‍ය/ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා පමණයි)

(24) දුරකථන බිල් දීමනාව -
විශේෂඥ වෛද්‍ය නිලධාරි - රු. 8,000.00 (මසකට)
වෛද්‍ය නිලධාරි - රු. 4,000.00 (මසකට)

(25) විශේෂ අතුරු දීමනාව මසකට රු. 5,000.00 ක් ගෙවනු ලැබේ.

6. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා* :- විටින්විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

7. *ඉල්ලුම්කරුවන්ට උපදෙස්* :

*අ.* පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිළිව සම්පූර්ණ කල යුතුය. ඉල්ලුම්පත් 2022 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ 'විධායක අධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ ඉහළ"............................... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

*ආ.* රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල / සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල /සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

*ඇ.* www.slaf.lk වෙබ් අඩවිය හරහා අයදුම්පත්‍ර භාගත කර ගැනීම් කල හැක.

*ඈ.* සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෛනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සමග **සහතික කරන ලද** ඡායාපිටපත් ඉදිරිපත් කල යුතුය.

(1) උප්පැන්න සහතිකය. (අධ්‍යාපන ව්‍යාවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කල සහතිකය වලංගු නොවේ).

(2) ජාතික හැඳුනුම්පත.

(3) අයදුම්කර ඇති ශාඛාවට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත්.

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(5) මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන්වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක් අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා සහතික හා විෂයය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

(7) මාස හයක් (6) ඇතුළත ලබාගන්නා ලද ග්‍රාම නිලධාරි සහතිකයක්.

(8) පාසල් හැරයාමේ සහතිකය,

(9) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්.

(10) අඟල් 2x2 ½ ප්‍රමාණයේ ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද වර්ණ ඡායාරූප දෙකක්.

ඉ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

ඊ. කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

උ. අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

ඌ. අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපුවට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්තමත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වල දී ඉවත් කරනු ලැබේ.

8. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක්කර තිබේනම් එම අසත්‍යතාවය අපේක්‍ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්‍ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

9. *තෝරාගැනීම සම්මුඛ පරීක්ෂණ ආදිය* :

අ. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේ ය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්‍ෂකයින් සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

ආ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්‍ෂකයින්ට සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ඇ. මෙම තනතුරු සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඈ. අපේක්‍ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කල යුත්තේ ඔහුට/ඇයට සහතිකයක් දීමෙනි. අපේක්‍ෂකයකු තෝරාගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්‍ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේ ය.

ඉ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

(එස් කේ පතිරණ),
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්), ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී,
යූඑස්පී, එම්එස්සී (එම්ඕඑ) යූඑස්ඒ, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා), එන්ඩීසී (ඉන්දියා), පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594.
කොළඹ.

| |
|---|
| *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |

**ශ්‍රී ලංකා නිත්‍ය /ස්වේච්ඡා ගුවන් හමුදාවේ . . . . . . . . . . . . . . . . . . ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.

   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ඉල්ලුම් කරන ශාඛාව :————.

5. ඉල්ලුම් කරන තනතුර :————.

6. ස්ථිර ලිපිනය :————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

8. ස්ථිර ලිපිනයට ආසන්න ගුවන් හමුදා කඳවුර :————.

9. අධ්‍යාපනය ලැබූ පාසල :————.

10. තැපැල් ලිපිනය :————.

11. විද්‍යුත් ලිපිනය :————.

12. උපන් දිනය :————.
    වයස : (2022.12.04 වැනි දිනට) අවුරුදු :———— මාස :———— දින :————

13. උස : සෙන්ටිමීටර් :————. (අඩි :———— අඟල් :————)

14. පපුව : අඟල් :————.

15. බර : කිලෝග්‍රෑම් :————.

16. දිස්ත්‍රික්කය :————.

17. ඡන්ද කොට්ඨාසය :————.

18. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය :————.

19. දුරකථන අංක :————. WhatsApp අංක :————.

20. විවාහක හෝ අවිවාහක බව :————.

21. පාසල් සහ/හෝ විශ්ව විද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | පොදු ඉංග්‍රීසි | |
| | | | සාමාන්‍ය පොදු පරීක්ෂණය | |
| විශ්වවිද්‍යාලයේ නම | | | | |
| විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම් | උපාධිය/ඩිප්ලෝමාව | | | |
| | ඕනෑම වෘත්තීය ආයතනයක සාමාජිකත්වයක් දරා තිබේද | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

23. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

24. මවුපියන් පිළිබඳ විස්තර ඃ-

| *සම්පූර්ණ නම* | *ජා.හැ.ප. අංකය* | *රැකියාව* | | *දැනට ලිපිනය* |
|---|---|---|---|---|
| | | *පෙර* | *දැනට* | |
| පියා ඃ- | | | | |
| මව ඃ- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ ඃ | | | | |
| | | | | |
| | | | | |

25. ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ කලින් ගුවන් හමුදා සේවයක් වේනම් ඒ පිළිබඳව විස්තර :

| නිලය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

26. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර : (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :————.

| අනු. අංක | විස්තරය | පාසල් | පළාත් | ජාතික | අන්තර්ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

27. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

28. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

29. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

30. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

31. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

32. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

33. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළවන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-94/2

## ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාව

## ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළව පුරප්පාඩු පවතින අතර ඒ සඳහා අවශ්‍ය අවම සහ විශේෂ සුදුසුකම් ඒ සමග දක්වා ඇත.

***මූලික අධ්‍යාපන සුදුසුකම්*** :

2. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

වෘත්තීය සහ අදාල අධ්‍යාපන සුදුසුකම්,

3. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් වේ. :

**අ. ගුවන් යානා ඉංජිනේරු වෘත්තීන් (පිරිමි/කාන්තා) නිත්‍ය**

(1) ගුවන්යානා සැකිලි ශිල්පී
(2) ගුවන්යානා යන්ත්‍ර ශිල්පී
(3) ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී
(4) ගුවන්යානා ආරක්ෂක උපකරණ ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සමත් ව ඉන් ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් තාක්ෂණික විද්‍යාපීඨයක් මගින් පිරිනමන ලද වසර දෙකක පූර්ණකාලීන ඉංජිනේරු ශිල්පීය පුහුණු (Electronics/Electrical) ජාතික සහතිකය හෝ වෙනත් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු පාඨමාලාවක් සමත් අයදුම්කරුවන් සඳහා ගුවන්යානා විදුලි සහ මෙවලම් ශිල්පී වෘත්තියට බඳවා ගැනීමේ දී ප්‍රමුඛත්වය දෙනු ලැබේ. තව ද ජාතික වෘත්තීය නිපුණතා (NVQ) මට්ටමේ සුදුසුකම් හෝ වෙනත් පිළිගත් ආයතනයකින් යාන්ත්‍රික විෂයයන් පිළිබඳව පුහුණුව සහ සේවා පළපුරුද්ද ලබා ඇති අයවළුන් හට ගුවන්යානා සැකිලි ශිල්පී සහ ගුවන්යානා යන්ත්‍ර ශිල්පී යන වෘත්තීන් සඳහා බඳවා ගැනීමේ දී ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**ආ. සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) - නිත්‍ය**

(1) අවි ආයුධ ශිල්පී
(2) ගුවන් ඡායාරූප ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සහිතව ගණිතය/විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සාමාන්‍ය සාමාර්ථද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තවද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික සහතිකය හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) රථවාහන කාර්මික ශිල්පී
(4) සාමාන්‍ය යාන්ත්‍රික ශිල්පී
(5) මතුපීට කාර්මික ශිල්පී
(6) ලෝහ තහඩු කාර්මික ශිල්පී
(7) යාන්ත්‍රික වඩු කාර්මික ශිල්පී
(8) ගුවන්යානා ගිනියම් පෑස්සුම් ශිල්පී
(9) ලියවන පට්ටල් ශිල්පී

සිංහල/දෙමළ භාෂාවන් සහිතව ගණිතය/විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයක් සඳහා සාමාන්‍ය සාමාර්ථය ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තවද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික සහතිකය හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(10) ප්‍රවාහන ක්‍රියාකරු

(අ) සිංහල/දෙමළ භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථය ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය.

(ආ) වලංගු සැහැල්ලු වාහන බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය වන අතර වලංගු බර වාහන බලපත්‍රයක් ලබා ඇති අයවලුන් හට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**ඇ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් - නිත්‍ය**

(1) ගගන ගුවන් විදුලි කාර්මික ශිල්පී (පිරිමි/කාන්තා)
(2) විදුලි සංනිවේදන කාර්මික ශිල්පී (පිරිමි)

සිංහල/දෙමළ, ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද ගණිතය/විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

(3) ගුවන් විදුලි සංනිවේදන (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය.

ඇ. වෛද්‍ය වෘත්තීන් (පිරිමි/කාන්තා) - නිත්‍ය

(1) හෙද සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ, ගණිතය/විද්‍යාව සහ වෙනත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් විද්‍යා/ගණිත/කෘෂි විද්‍යා විෂයය ධාරාවන්ගෙන් පහත දක්වෙන ආකාරයෙන් සාමාර්ථයන් ලබා තිබීම. එහි ඉදිරියෙන් දක්වා ඇති වෘත්තීන්ට (හෙද සහතිකය වෘත්තිය යටතේ) අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ උසස් වෘත්තිය පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකමක් වේ.

| | |
|---|---|
| අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ.පො.ස. උ. පෙළ ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/කෘෂි විද්‍යාව යන විෂයන්ගෙන් 3ක් හදාරා සියලුම විෂයයන් එක් වරක දී සමත්ව තිබීම. | හෙද ඩිප්ලෝමාව (පිරිමි/කාන්තා) |
| අ.පො.ස. (සා.පෙළ.) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ.පො.ස. (උ. පෙළ) ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය/භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් හා රසායන විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | ඖෂධවේදී (පිරිමි)<br>රසායනාගාර කාර්මික ශිල්පී (පිරිමි/කාන්තා) |
| අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ. පො. ස. (උ.පෙළ) රසායන විද්‍යාව/භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ජීව විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම. | විද්‍යුත් කන්තුක රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා)<br>විද්‍යුත් නිකර්පණ රේඛණ ශිල්පී (පිරිමි/කාන්තා) |

| | |
|---|---|
| අ.පො.ස. (සා.පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් හා අ.පො.ස. (උ. පෙළ) රසායන විද්‍යාව/ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද භෞතික විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත්ව තිබීම | විකිරණ ශිල්පි (පිරිමි/කාන්තා)<br>භෞත චිකිත්සක (පිරිමි/කාන්තා)<br>අක්ෂි තාක්ෂණවේදී (පිරිමි/කාන්තා) |
| අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හා අ.පො.ස (උ. පෙළ) රසායන විද්‍යාව/භෞතික විද්‍යාව /කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ද ජීව විද්‍යාව/සංයුක්ත ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව එක් වරක දී සමත් ව තිබීම. | සෞඛ්‍ය පරීක්ෂක (පිරිමි) |

(ඉ) දන්ත සහයක (පිරිමි/කාන්තා) නිත්‍ය

සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව සහ වෙනත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ.පෙළ) විභාග සමත් ව තිබීම සහ ජීව විද්‍යා විෂය ධාරාව හදරා විෂයයන් තුනක් එක් වරක දී සමත්ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

ඊ. පරිපාලන වෘත්තීන් (පිරිමි/කාන්තා) නිත්‍ය

(1) පරිපාලන සහයක

සිංහල/දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයන් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) ගිණුම් සහයක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

උ. මෙහෙයුම් වෘත්තීන් - නිත්‍ය

(1) මෙහෙයුම් ගුවන් (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය.

(2) ගිනි නිවන්නා (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. බර වාහන රියදුරු බලපත්‍රයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) මෙහෙයුම් භූමි (පිරිමි/කාන්තා)

(4) සුනඛ පාලක (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය.

(5) මෙහෙයුම් භූමි (ක්‍රීඩා භූමි නඩත්තු) ස්වේච්ඡා (පිරිමි)

අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී. සිටීම, ක්‍රීඩා භූමි නඩත්තු ක්ෂේත්‍රවල පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

ඌ. සැපයුම් වෘත්තීන් - නිත්‍ය

(1) සැපයුම් සහායක (පිරිමි/කාන්තා)

(2) ගුවන් යානා ඉන්ධන සැපයුම්කරු (පිරිමි)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහ ගණිතය/විද්‍යාව/ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක් ද සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. පරිගණක පිළිබඳ දැනුම තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) සලාක සහයක (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය.

(4) භෝජනාගාර සහායක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සමත් සහතිකයක් ලබා තිබීම සහ සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලත් හෝ පිළිගත් ප්‍රසිද්ධ හෝටලයක භෝජනාගාර සේවක, බීමහල් සේවක, කාමර සහයක යන අංශයන්ගෙන් සේවා පළපුරුද්දක් ලබා ඇති අයවලුන් හට ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

එ. පොලිස් (පිරිමි/කාන්තා) - නිත්‍ය

සිංහල/දෙමළ, ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. උස අඩි 5 අඟල් 8 ට නොඅඩු පිරිමි හා අඩි 5 අඟල් 6 ට නොඅඩු කාන්තා අයවළුන් හට බඳවා ගැනීමේ දී ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

ඒ. සංගීතඥ (පිරිමි) - නිත්‍ය

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. බටහිර/පෙරදිග සංගීත භාණ්ඩ වාදනය කිරීමේ හැකියාව, බටහිර/පෙරදිග සංගීත අංකන ගායනා කිරීම/කියවීම සහ ලිවීමේ හැකියාව අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සංගීත විෂයේ (බටහිර/පෙරදිග) න්‍යාය හෝ ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම හා පාසලේ බටහිර/ශිෂ්‍යභට/බ්‍රාස් තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකයෙකු වීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

ඔ. ශාරීරික අභ්‍යාස පුහුණුකරු (පිරිමි/කාන්තා) - නිත්‍ය

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. ක්‍රීඩාවලින් ජාතික මට්ටමින් ලබාගත් ජයග්‍රහණයන්, තෝරා ගැනීමේ දී විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. මූලික සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් විශේෂ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත්විය යුතුය.

ඕ. සිවිල් ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) - නිත්‍ය

(1) යාන්ත්‍රික කාර්මික ශිල්පි
(2) ඉදිකිරීම් උපකරණ කාර්මික ශිල්පි

සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන් සහිත වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තවද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින්, පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික සහතිකය හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(3) ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී
(4) මෝටර් එතීමේ ශිල්පී

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් ව තිබිය යුතුය. තවද වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින්, පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික සහතිකය හෝ සේවා පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවේ ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පහත සඳහන් වෘත්තීන්ට අදාළ ව ඉදුරාම බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පවතී**

4. වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් :-

අ. සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)

(1) රථවාහන කාර්මික ශිල්පී - නිත්‍ය

සිංහල/දෙමළ විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය. තව ද පහත සඳහන් එක් සුදුසුකමක් තිබිය යුතුය.

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පී (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී, ඉන්ජෙක්ටර් පොම්ප කාර්මික ආදිය) පිළිබඳව මාස හයක පූර්ණ කාලීන හෝ වසරක අර්ධකාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

සහ

ජාතික වෘත්තීය නිපුණතා අදියර II (NVQ Level II) හෝ ඊට වැඩි සුදුසුකම් ලබා තිබීම.

සහ

මෝටර් රථ කාර්මික ශිල්පී/රථ වාහන නඩත්තුව පිළිබඳව අවම වශයෙන් වසරක පළපුරුද්ද

(2) රථවාහන කාර්මික ශිල්පී - ස්වේච්ඡා

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

මෝටර් රථ කාර්මික ශිල්පී (මෝටර් රථ කාර්මික ශිල්පී, මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී, ඉන්ජෙක්ටර් පොම්ප කාර්මික ආදිය) පාඨමාලාවක් සඳහා ජාතික වෘත්තීය නිපුණතා අදියර II (NVQ Leval II) හෝ ඊට වැඩි සුදුසුකම් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක මාස හයක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද

හෝ

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පී (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී, ඉන්ජෙක්ටර් පොම්ප කාර්මික ආදිය) පිළිබඳව වසරක පූර්ණ කාලීන හෝ වසර දෙකක අර්ධකාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ පිළිගත් ආයතනයක වසරක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද.

හෝ

රජයේ ආයතනයක හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මෝටර් රථ කාර්මික ශිල්පි (මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී, මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පී, මෝටර් සයිකල් හා ත්‍රීරෝද රථ කාර්මික ශිල්පී, ඉන්ජෙක්ටර් පොම්ප කාර්මික ආදිය) පිළිබඳව මාස හයක පූර්ණ කාලීන හෝ වසරක අර්ධකාලීන පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ පිළිගත් ආයතනයක වසර දෙකක හෝ ඊට වඩා වැඩි පළපුරුද්ද.

(3) මතුපිට කාර්මික ශිල්පී (රසායනාගාර කාර්මික ශිල්පී) නිත්‍ය (පිරිමි)

සිංහල/දෙමළ විෂයයන් සහිතව ගණිතය හෝ විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයක් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම සහ අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම. මෙම ක්ෂේත්‍රයේ වෘත්තීය සුදුසුකම්/සේවා පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

ආ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු වෘත්තීන් (පිරිමි) - නිත්‍ය

(1) ගඟන ගුවන් විදුලි කාර්මික ශිල්පී
(2) විදුලි සන්නිවේදන කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් සහිතව ගණිතය/විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන සාමාර්ථයක්ද ඇතුළුව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද පූර්ණකාලීන දෑ අවුරුදු ඉංජිනේරු ශිල්පීය ජාතික (විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික්) පාඨමාලා සහතිකයක් තිබිය යුතුය. ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) හෝ ඒ හා සමාන සහතිකයක් ලබා තිබීම.

හෝ

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තෙවසරක ජාතික තාක්ෂණ සහතිකය (NCT) (ඉලෙක්ට්‍රෝනික/විදුලි) සාර්ථකව නිම කිරීම.

ඇ. සිවිල් ඉංජිනේරු වෘත්තීන් (පිරිමි)-නිත්‍ය

(1) වැඩ මූලික (සිවිල්/විදුලි/යාන්ත්‍රික)

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

ජාතික තාක්ෂණික සහතිකය NCT (Civil/Electrical/Mechanical Engineering) අර්ධ කාලීන තුන් අවුරුදු පාඨමාලාව හෝ රජයේ වෙනත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ඊට සමාන සුදුසුකම් ඇති පාඨමාලාවක් සමත් ව තිබීම සහ වෘත්තියේ වසර දෙකක (02) සේවා පළපුරුද්ද පිළිබඳ සනාථ කිරීම

ඈ. විගණන වෘත්තීන් (පිරිමි) - නිත්‍ය

(1) විගණන සහයක

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ.) විභාගය සමත්ව තිබිය යුතුය. අ.පො.ස. (උ. පෙළ) වාණිජ විෂය ධාරාවෙන් හදාරා ඉන් සමත්ව තිබිය යුතුයි.

සහ

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර I (AAT Stage I) සමත්ව තිබීම.

හෝ

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර II (AAT Stage II) සමත්ව තිබීම.

හෝ

රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) හි පළමු වසර අවසන් කර තිබීම.

හෝ

රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයකින් ලබා ගන්නා උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව (HNDBF) හි පළමු වසර විභාගය සම්පූර්ණ කර තිබීම ;

සහ

විගණනය සහ ගිණුම්කරණ ක්ෂේත්‍රයේ මාස හයකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

ඉ. පරිපාලන වෘත්තීන් (පිරිමි/කාන්තා) - ස්වේච්ඡා

(1) අධ්‍යාපන පරිපාලක (දෙමළ භාෂා උපදේශක)

දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබීම සහ අ.පො.ස. (උ. පෙළ) විභාගය දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. තව ද, මෙම ක්ෂේත්‍රයට අදාළව රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ඩිප්ලෝමා/පාඨමාලාවක් හදාරා තිබීම සහ ගුරු වෘත්තියේ වසරක හෝ ඊට වැඩි සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

ඊ. සැපයුම් වෘත්තීන් - ස්වේච්ඡා

(1) සලාක සහයක (පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

පිළිගත් හෝටල් පාසලක ශිල්පීය/වෘත්තීය ඉවුම් පිහුම් පාඨමාලා සහතිකය හෝ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ Level I, II හෝ III) හෝ වෙනත් වෘත්තීය පුහුණු පාසලක (TVEC) ඉවුම් පිහුම් පාඨමාලා සහතිකය හෝ තරු පන්තියේ හෝටලයක වසරක හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(2) භෝජනාගාර සහයක (පිරිමි/කාන්තා)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අවම වශයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

ඉංග්‍රීසි භාෂාව මනාව හැසිරවිය හැකි සත්කාරක කළමනාකරණය පිළිබඳව පාඨමාලා සහතිකය ඇති සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ Level I, II, III හෝ IV) ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා සමත් සහතිකයක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම හෝ තරු පන්තියේ හෝටලයක පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

උ. මෙහෙයුම් භූමි වෘත්තීන් - ස්වේච්ඡා

(1) මෙහෙයුම් භූමි (රූපලාවන්‍ය ශිල්පී) (කාන්තා/පිරිමි)

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා./පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV (NVQ Level IV) සහතිකය තිබීම අනිවාර්ය වන අතර අදාළ ක්ෂේත්‍රය පිළිබඳව වසර 01කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

ඌ. තොරතුරු තාක්ෂණ වෘත්තීන් - නිත්‍ය (පිරිමි)

(1) පරිගණක කාර්මික ශිල්පී

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා./පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

රජයේ හෝ රජයේ ලියාපදිංචි පෞද්ගලික ආයතනයක මාස හයක පූර්ණකාලීන හෝ වසරක අර්ධකාලීන තොරතුරු තාක්ෂණ පාඨමාලා සහතිකයක් (Network/Software Developer, Software and Hardware repairing) තිබීම අනිවාර්ය වන අතර අදාළ ක්ෂේත්‍රය පිළිබඳව වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

5 අනෙකුත් සුදුසුකම් :-

(අ) ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා නිත්‍ය/ස්වේච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුයි.

| | | | |
|---|---|---|---|
| (1) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (2) | වයස | : | 2023 අප්‍රේල් මස 30 වන දිනට<br>නිත්‍ය<br>පිරිමි - අවුරුදු 18ත් 23ත් අතර<br>කාන්තා - අවුරුදු 18ත් 22ත් අතර<br><br>ඉඳුරාම බඳවාගැනීම් (නිත්‍ය/ස්වේච්ඡා)<br>පිරිමි - අවුරුදු 18-28ත් අතර<br>පිරිමි - අවුරුදු 18 - 30 ත් අතර (රථවාහන කාර්මික ශිල්පී - ස්වේච්ඡා අපේක්ෂකයින් සඳහා)<br>කාන්තා - අවුරුදු 18-26 ත් අතර<br><br>ස්වේච්ඡා<br>පිරිමි - අවුරුදු 18 - 28 ත් අතර<br>කාන්තා - අවුරුදු 18 - 26 ත් අතර |
| (3) | උස | : | අඩි 5 අඟල් 5 ට : 165 cm - නොඅඩු විය යුතුයි (පිරිමි)<br>අඩි 5 අඟල් 3 ට : 160.2 cm - නොඅඩු විය යුතුයි (ක්‍රීඩාභූමි නඩත්තු) (පිරිමි)<br>අඩි 5 අඟල් 3 ට : 160.2 cm - නොඅඩු විය යුතුයි (කාන්තා) |
| (4) | බර | : | පිරිමි - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 26 (පිරිමි)<br>කාන්තා - 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25 (කාන්තා)<br>ශරීර ස්කන්ධ දර්ශකය = බර(කි. ග්‍රෑ.) / උස(මී) $^2$ |
| (5) | වර්ණ දෘෂ්ටිය | : | සීපී 2 : $CP_2$ |
| (6) | දෘෂ්ටි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත) |
| (7) | පපුව | : | අඟල් 32 ට නොඅඩු විය යුතුය. (පිරිමි) |
| (8) | සිවිල් තත්ත්වය | : | නිත්‍ය - අවිවාහක<br>ස්වේච්ඡා හා ඉඳුරාම බඳවා ගැනීම - විවාහක/අවිවාහක |

(අ) නිත්‍ය ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් අවිවාහක විය යුතු අතර ගුවන් හමුදාවට බැඳී වසර හතරක් (04) ගතවන තුරු විවාහ වීමට ගුවන් භටයින්ට/ගුවන් කාන්තාවන්ට අවසර දෙනු නොලැබේ.

(ආ) අවිවාහක වයස අවුරුදු 25ට වැඩි බඳවා ගන්නා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදාවට බැඳී වසරක් (01) ගතවීමෙන් පසු විවාහ වීමට අවසර දෙනු ලැබේ.

(ඇ) අවිවාහක ඉඳුරාම සහ ස්වේච්ඡා බඳවා ගන්නා ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් හට ගුවන් හමුදවට බැඳී වසරක් (01) ගතවීමෙන් පසු විවාහ වීමට අවසර දෙනු ලැබේ.

6. තුන්වන සහ හතරවන ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ පස්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් හෝ සපුරා නොමැති අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගේ අයඳුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිම්වලට අනුව උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

7. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ඨතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැළකිල්ලක් දක්වනු ලැබේ.

8. *සේවා කොන්දේසි* ඃ-

අ. අපේක්ෂකයින් අනෙකුත් නිලයන් හා සමාන ව මූලිකව නිත්‍ය/ස්වේච්ඡා සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාවන් හැදැරිය යුතුවේ. ආධුනිකයා ලබා ඇති වෘත්තිය අනුව මූලික ගොඩබිම් සටන් පුහුණුවීමේ පාඨමාලාව සහ වෘත්තීය පුහුණුව නිමවීමෙන් පසු ඔහු / ඇය වෘත්තියේ ගුවන්හටයෙකු/ගුවන් කාන්තාවක ලෙස සේවයෙ හි පිහිටුවනු ලැබේ.

ආ. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සූදානමින් සිටිය යුතුය.

ඇ. පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුදා නීතියට යටත් විය යුතුයි.

ඈ. සෑම ආධුනිකයෙකුට ම සියළුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

ඉ. පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුදා හෝජනාගාර තුළින් ආහාර සපයනු ලැබේ.

ඊ. පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියළුම වියදම් එම ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

උ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු / ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුද සේවයෙන් මුදහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී අදාළ ආධුනිකයාගේ මව / පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු / ඇය වෙනුවෙන් දරා ඇති සියළුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමඟ බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

ඌ. මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 32 වෙනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමඟ මේ බව තහවුරු කරන ඔප්පුවකට බැඳිය යුතුයි.

එ. පළමුවන ඡේදයේ සිට පස්වන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින්, මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන් හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දක් වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

ඒ. අවිවාහක ගුවන් හටයින්/ගුවන් කාන්තාවන්, ගුවන්හට/ගුවන් කාන්තා නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් හටයින්ගේ ආහාර දීමනා ගුවන්හට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

ඔ. විවාහක ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදළ පරිදි අය කරනු ලැබේ.

ඕ. සියලුම ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් රාජකාරි හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

ක. සියලුම ගුවන් හටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

9. *බඳවා ගැනීමේ කොන්දේසි* :-

අ. ***නිත්‍ය ගුවන් හටයින් හා ගුවන් කාන්තාවන් සඳහා*** : තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් නිත්‍ය ගුවන් හමුදවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් හට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 12ක සේවා කාලයකට යටත් විය යුතුයි. ඉන් වසර 08ක් අඛණ්ඩව සේවය කළ යුතු අතර, එම කාල සීමාව නිමවීමෙන් පසු වසර 04ක් නිත්‍ය උප සේවයට (අපේක්ෂිත කණ්ඩායමේ) කැඳවීමක් කළ අවස්ථාවකදී වාර්තා කළ යුතුයි. අවුරුදු 08ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත සේවය දීර්ඝ කිරීමට සුදුසු ගුවන්හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

ආ. ***ස්වේච්ඡා ගුවන් හටයින් හා ගුවන් කාන්තාවන් සඳහා*** : තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදවේ තුන්වන ශ්‍රේණියේ ගුවන්හට නිලයට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 05ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 05ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබා දෙනු ඇත.

ඇ. ***සැපයුම්/මෙහෙයුම් භූමි/රථවාහන කාර්මික ශිල්පී අධ්‍යාපන පරිපාලන (දෙමළ භාෂා උපදේශක) ස්වේච්ඡා ගුවන් හටයින් හා ගුවන් කාන්තාවන් සඳහා*** : තෝරා ගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා ගුවන් හමුදවේ තුන්වන ශ්‍රේණියේ ගුවන්හට නිලයට/ගුවන් කාන්තා නිලයට ඇතුළත් කරනු ලබන අතර ඔවුන් වසර 02ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 02ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා සුදුසු ගුවන් හටයින්ට/ගුවන් කාන්තාවන්ට අවස්ථාව ලබාදෙනු ඇත.

10. *රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන්* : තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

11. *වැටුප් හා දීමනා* :

අ. නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් හටයින්ට අදල මූලික වැටුප සහ දීමනා ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| *නිලය* | *මූලික වැටුප රුපියල්* | *අනෙකුත් දීමනා+ සළාක දීමනා රුපියල්* | *අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප රුපියල්* |
|---|---|---|---|
| ගුවන්හට | 29,540.00 | 17,250.00+19,995.62 | 66,785.62 |
| නායක ගුවන්හට | 30,440.00 | 17,250.00+19,995.62 | 67,685.62 |
| කෝප්‍රල් | 31,340.00 | 17,250.00+19,995.62 | 68,585.62 |

***සැලකිය යුතුයි*** .- පිටත වාසය කරන ගුවන් හටයින්ට මසකට රු. 20,000.00 ක පමණ ආහාර දීමනා සහ අදළ පරිදි ගෙවල් කුළී දීමනාව ගෙවනු ලැබේ.

(ආ) **විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා** :- වරින් වර සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුව විශ්‍රාම වැටුප්/පරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලු ගුවන්භටයින්/ගුවන් කාන්තාවන් දායක විය යුතුයි. අරමුදලට ගෙවිය යුතු දායක මුදල්වල අනුප්‍රමාණය 1970 වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදල් රෙගුලාසි අනුව වේ.

12. *ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස්* :-

අ, පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කල යුතුයි. ඉල්ලුම්පත් **2022 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00 ට** පෙර ලැබෙන සේ "**ආධුනිකයින් බඳවා ගැනීමේ විධායක නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පතේ ඉහල වම් කෙලවරේ ''**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය/ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත**'' යනුවෙන් සඳහන් කල යුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කල යුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරග න්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල වෙත ලැබුනාවූ ද, මේ නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නාවූ ද ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

ආ. රාජ්‍ය සේවයේ / සංස්ථා / මණ්ඩල /සිවිල් ආයතනයන් හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තව ද යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක් ද ඒ සමඟ තිබිය යුතුයි.

ඇ. අයදුම්කරුවන් සඳහා අයදුම්පත්‍ර www.slaf.lk යන වෙබ් අඩවියෙන් බාගත කල හැක.

ඈ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කල යුතුයි.

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කල සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ),

(2) ජාතික හැඳුනුම්පත,

(3) අයදුම්කර ඇති වෘත්තියට අදාල අධ්‍යාපන සුදුසුකම් ඇති බව තහවුරු කිරීමට අධ්‍යාපන සහතිකපත් වල මුල්පිටපත් (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ සහතික හෝ පාසලෙන් ලබාගත් සහතිකයක් නම් නිලමුද්‍රාව සඳහන්ව තිබිය යුතුය),

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය / කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(5) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, (මාස 06කට නොඅඩු කාලයකින්). මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය,

(6) ක්‍රීඩා සහතික හා විෂයය පරිබාහිර ක්‍රියාකාරකම් පිළිබඳ සහතිකවල මුල්පිටපත් හා ඡායා පිටපත බැගින්.

(7) මාස හයක් (6) ඇතුළත ලබාගන්නා ලද ග්‍රාම නිළධාරි සහතිකයක්,

(8) පාසල් හැරයාමේ සහතිකය,

(9) කාඩ්බෝඩ් ෆයිල් කවරයක් හා ෆයිල් ලේස් එකක්,

(10) ග්‍රාම නිළධාරී විසින් සහතික කරන ලද අඟල් 2 x 2 ½ උඩුකය වර්ණ ඡායාරූපයක්.

ඉ. නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වය ගැන සලකා බලනු නොලැබේ.

ඊ. කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

උ. අයදුම්පත සමඟ සහතික වල මුල් පිටපත් එවා, ඒවා නැති වුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

ඌ. අයදුම්පත්‍රවල සඳහන් අධ්‍යාපන සුදුසුකම් උස, වයස, පපුවෙහි වට ප්‍රමාණය වැනි මූලික අවශ්‍යතාවයන්වල දත්තමත පදනම්ව මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් කැඳවන අතර අයදුම්පත්‍රවල සාවද්‍ය තොරතුරු සපයා ඇති අයදුම්කරුවන් මූලික පරීක්ෂාවන්වලදී ඉවත් කරනු ලැබේ.

13. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම් වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්හට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුද බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතු වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

14. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

15. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ගුවන් හමුද ප්‍රමිතියට අනුකූලව වෛද්‍ය පරීක්ෂණයට හා ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු යි.

16. සම්මුඛ පරීක්ෂණවලින් ලබාගන්නා ලකුණු වල අගය අනුව අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් තෝරාගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

17. අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කල යුත්තේ ඔහුට / ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙලඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතුවන්නේය.

18. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

එස් කේ පතිරණ,
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්), ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී,
යූඑස්පී, එම්එස්සී (එම්ඕඑ) යූඑස්ඒ, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා), එන්ඩීසී (ඉන්දියා), පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති.

ගුවන් හමුදාධිපති,
මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594,
කොළඹ-02

| *කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා* |
|---|

**ශ්‍රී ලංකා නිත්‍ය / ස්වේච්ඡා ගුවන් හමුදාවේ ආධුනික ගුවන් භට/ගුවන් කාන්තාවන් සඳහා ඉල්ලුම්පත**

**ගුවන් හමුදාවේ . . . . . . . . . . වෘත්තිය**

1. පුරවැසිභාවය :—————.

   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම : (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. ස්ථිර ලිපිනය :—————.

5. තැපැල් ලිපිනය :—————.

6. උපන් දිනය :—————.
වයස : (2023 අප්‍රේල් මස 30 වන දිනට) අවුරුදු :—————. මාස :—————. දින :—————.

7. උස : සෙන්ටිමීටර් :————. (අඩි :————. අඟල් :————.)

8. පපුව : අඟල් :—————.

9. බර : කිලෝග්‍රෑම් :—————.

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

11. ස්ථිර ලිපිනයට අයත් ගුවන් හමුදා කඳවුර :—————.

12. දිස්ත්‍රික්කය :—————.

13. ඡන්ද කොට්ඨාසය :—————.

14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය සහ අංකය :—————.

15. දුරකථන අංක :—————. WhatsApp අංක :—————.

විද්‍යුත් ලිපිනය :—————.

16. විවාහක හෝ අවිවාහක බව :—————.

17. ස්ත්‍රී / පුරුෂ භාවය :—————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් : ප්‍රාථමික :—————.

ද්විතීක :—————.

19. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව)* | |
|---|---|---|---|---|
| | *අ.පො.ස. (සා.පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *අ.පො.ස. (උ. පෙළ)* | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | *විශ්වවිද්‍යාල/වෙනත් සුදුසුකම්* | | | |

20. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

21. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

22. මව්පියන් පිළිබඳ විස්තර ඃ-

| සම්පූර්ණ නම | ජා.හැ.ප. අංකය | රැකියාව | | වර්තමාන ලිපිනය |
|---|---|---|---|---|
| | | පෙර | දැනට | |
| පියා ඃ- | | | | |
| මව ඃ- | | | | |
| සහෝදර සහෝදරියන්ගේ ඃ | | | | |
| | | | | |
| | | | | |

23. ලේ ඥාතීන් කවරෙකු හෝ දැනට හෝ කලින් ගුවන් හමුදා සේවයක් වේනම් ඒ පිළිබඳව විස්තර ඃ

| නිලය | නම | ශාඛාව/වෘත්තිය | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| | | | |

24. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

| අනු අංක | විස්තරය | පාසල් | පළාත් | ජාතික | අන්තර්ජාතික |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

25. පාසලේ දී, විශ්ව විද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

26. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

27. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :————.

28. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

29. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

30. *චරිත සහතික පිළිබඳ විස්තර* :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |
| | | |

31. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්භට/ගුවන් කාන්තාවන් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා එයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

32. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

(*අ*) ඉහත අයදුම්පතේ 31 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ..................... නමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරාගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි :

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී ඉහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වේච්ඡාවෙන් ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම,

(2) විෂමාචාරය නිසා *නැතහොත්* ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිලයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

—————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :—————.
නම :—————.
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය :—————.

—————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය :—————.
නම :—————.
(පැහැදිලි අකුරෙන්)
ලිපිනය :—————.

—————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

දිනය :—————.
නම :—————.
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :—————.

11-121

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා වන සීමිත බඳවා ගැනීම -2022 වර්ෂය**

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සහකාර අධිපන්තියේ (MN7-2016) මූලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩු 11ක් (එකොළහක්) සඳහා සීමිත බඳවා ගැනීම යටතේ, මෙහි පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලන නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ***සුදුසුකම්*** :

1.1. *අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද* :

I. කාණ්ඩ I - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම,

*හෝ*

II. කාණ්ඩ II - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ II ශ්‍රේණියේ වසර අට (08) ක සක්‍රීය හා සතුටුදායක සේවා කලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම,

*හෝ*

III. කාණ්ඩ III - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ III ශ්‍රේණියේ වසර පහක (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකු වීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් ක්‍රීඩා හෝ කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

***සටහන*** : සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන පරිදි සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් නොමැත්තේ නම් පමණක් සේවා අවශ්‍යතාවය මත සේවා ව්‍යවස්ථාවේ සඳහන් අනෙකුත් සුදුසුකම් සපුරා ඇති 2021.09.26 වැනි දිනට ක්‍රීඩා පුහුණුකරු II පන්තියේ සේවා කාලය වසර පහක් (05) සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ අයදුම්පත් සලකා බලනු ලැබේ.

***සැලකිය යුතුයි*** : ඉල්ලුම් කරනු ලබන කාණ්ඩය අනුව සේවා පළපුරුද්ද සඳහා ලකුණු ලබා දෙන ආකෘතිය විස්තරාත්මක ලකුණු පටිපාටියේ සඳහන් වේ :

1.2. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

1.3. *වෙනත් සුදුසුකම්* :

I. තනතුර ස්ථිර කර තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

III. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීම.

i. III ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු සඳහා එම ශ්‍රේණියට පත්ව වසර 03 ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතුය,

ii. II ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු සඳහා එම ශ්‍රේණියට පත්ව වසර 03 ක් ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතුය,

iii. I ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු සඳහා - I ශ්‍රේණියට පත්ව වසර 03 ක් ඉක්මවා ඇති නිලධාරීන් III වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබිය යුතුය.

IV. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතා ලබා ගෙන තිබීම.

V. <u>අයදුම්පත් කැඳවන අවසාන දිනට</u> ඉහත දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

02. වයස ඃ අදාළ නොවේ.

03. 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප රු. 41,580 - 11x775-18x1,030-රු.68,425 (MN -7-2016) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. *බඳවා ගන්නා ක්‍රමය ඃ*
මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පහත දක්වෙන විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුව ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා පිළිවෙල අනුව සුදුසු පුද්ගලයන් තෝරා ගනු ලැබේ.

*විස්තරාත්මක ලකුණු පටිපාටිය ඃ*

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| **1. අතිරේක සේවා පළපුරුද්ද** | I. ඉහත 1.1 හි I කාණ්ඩය යටතේ ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා පහත පරිදි I ශ්‍රේණියේ හා / හෝ II ශ්‍රේණියේ මුළු සේවා කාලය සඳහා ලකුණු ලබා දේ.<br>*a.* ක්‍රීඩා පුහුණුකරු I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා වසරකට 5 බැගින්<br>*b.* ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසර 8කට අමතරව සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා වසරකට 3 බැගින්<br><br>II. ඉහත 1.1 හි II කාණ්ඩය යටතේ ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා<br>*a.* ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසර 8කට අමතරව සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා වසරකට 3 බැගින්,<br><br>III. ඉහත 1.1 හි සටහන අනුව II කාණ්ඩය යටතේ ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා<br>*a.* ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසර 5කට අමතරව සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා වසරකට 3 බැගින්,<br><br>IV. II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසර 8 සම්පූර්ණ නොමැති III කණ්ඩය යටතේ ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා<br>*a.* II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසරකට ලකුණු 3 බැගින්<br>*b.* ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතර ව සම්පූර්ණ කර ඇති III ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසරකට ලකුණු 1 බැගින්,<br><br>V. දැනට III ශ්‍රේණියේ සිටින III කාණ්ඩය යටතේ ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් සඳහා ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ වසර 5ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලය<br>*a.* ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ වසර 5 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අමතර ව සම්පූර්ණ කර ඇති III ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක වසරකට ලකුණු 1 බැගින් | 30 |

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 02. **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | ක්‍රීඩා පරිපාලනය හෝ ක්‍රීඩා කළමනාකරණය ආශ්‍රිත විෂයයන් පිළිබඳ හදාරන ලද පාඨමාලා<br>i. ක්‍රීඩා විද්‍යාව හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ කළමනාකරණය හෝ පරිපාලනය හෝ ක්‍රීඩා පරිපාලනය පිළිබඳ දේශීය /විදේශීය පශ්චාත් උපාධිය (ශාස්ත්‍රපති / කළමනාකරණ මට්ටම) -ලකුණු 25<br>ii. ක්‍රීඩා විද්‍යාව හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ කළමනාකරණය හෝ පරිපාලනය හෝ ක්‍රීඩා පරිපාලනය කටයුතු පිළිබඳ දේශීය /විදේශීය උපාධිය - ලකුණු 20<br>iii. උසස් ඩිප්ලෝමා (දේශීය/විදේශීය) - ලකුණු 15<br><br>1. වසරක් හෝ ඊට වැඩි - ලකුණු 15<br>2. මාස 06ක් හෝ ඊට වැඩි - ලකුණු 10<br>3. සති 2කට වඩා වැඩි - ලකුණු 07<br>4. සති 02කට වඩා අඩු දින 2ට වැඩි - ලකුණු 03<br><br>iv. උසස් අධ්‍යාපන පාඨමාලා (දේශීය/විදේශීය) - ලකුණු 7<br><br>1. මාස 06ක් හෝ මාස 03 අතර - ලකුණු 07<br>2. මාස 03ට අඩු සති 02කට වැඩි - ලකුණු 04<br>3. සති 02ට අඩු දින 02කට වැඩි - ලකුණු 02<br><br>• උපරිම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු හිමිවේ.<br>• බඳවා ගැනීමේ දී හෝ මෙම උසස්වීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් යටතේ සලකා බැලූ පාඨමාලා/ උපාධි සඳහා ලකුණු හිමි නොවේ.ඉහත සියලු සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් හෝ රජය පිළිගත් විදේශීය පුහුණු ආයතනයකින් ලබා තිබිය යුතුය.<br>• අර්ධ කාලීන පාඨමාලා සඳහා ලකුණු ලබා දීමේ දී පූර්ණ කාලීන වර්ෂයක පාඨමාලාවකින් අධ්‍යන පැය 1500 ක් ආවරණය කෙරෙන ලෙස සලකා ලකුණු ගණනය කෙරෙනු ඇත.<br><br>• ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය. | 25 |
| 03. **ක්‍රීඩා පුහුණුකරු/ ක්‍රීඩා නිලධාරී තනතුරේ දී දක්වන ලද විශේෂ දක්ෂතාවන්** | ක්‍රීඩකයන් බිහි කිරීම - ජාත්‍යන්තර මට්ටම<br>(ඔලිම්පික් ක්‍රීඩා උළෙල, ලෝක ශූරතා, පැරාඔලිම්පික් තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල, ආසියානු ක්‍රීඩා උළෙල, දකුණු ආසියානු ක්‍රීඩා උළෙල)<br><br>කේවල තරග (කනිෂ්ඨ/ජ්‍යෙෂ්ඨ)<br>1 වන ස්ථානය - ලකුණු 10<br>2 වන ස්ථානය - ලකුණු 08<br>3 වන ස්ථානය - ලකුණු 06<br>සහභාගීත්වය - ලකුණු 04<br><br>කණ්ඩායම් තරග : කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ)<br>1 වන ස්ථානය - ලකුණු 10<br>2 වන ස්ථානය - ලකුණු 08<br>3 වන ස්ථානය - ලකුණු 06<br>සහභාගීත්වය - ලකුණු 04 | 20 |

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | **ජාතික මට්ටම (ජාතික මහා ක්‍රීඩා උළෙල/ ක්‍රීඩා සංගම්/ සම්මේලන/ජාතික ශූරතාවය)**<br><br>**කේවල තරග**<br>1 වන ස්ථානය - ලකුණු 06<br>2 වන ස්ථානය - ලකුණු 04<br>3 වන ස්ථානය - ලකුණු 02<br><br>**කණ්ඩායම් තරග**<br>1 වන ස්ථානය - ලකුණු 04<br>2 වන ස්ථානය - ලකුණු 03<br>3 වන ස්ථානය - ලකුණු 02<br><br>• මෙම ක්‍රීඩා ජයග්‍රහණ සඳහා අයදුම්කරුගේ දායකත්වය, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහතිකයේ සහතික කළ පිටපතක් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ අත්සන සහිත ලිපියක් මගින් තහවුරු කළ යුතුය.<br><br>**තරග හැර විවිධ ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේ දී කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබීම. ලකුණු 03**<br>(ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය.)<br>(අවස්ථාවකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 3)<br><br>**ක්‍රීඩාවේ සංවර්ධනය වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.**<br>(ආයතන ප්‍රධානියා මගින් සහතික කරවා ගන්නා ලද සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය.) - ලකුණු 03<br>(එක් ව්‍යාපෘතියකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 03)<br><br>**ක්‍රීඩා සංගම්/සම්මේලන සම්බන්ධීකරණ කටයුතු සඳහා ලබා දී ඇති දායකත්වය.**<br>(ආයතන ප්‍රධානියා මගින් සහතික කරවා ගන්නා ලද සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය.)<br>(එක් අවස්ථාවකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 02) - ලකුණු 2<br><br>**ක්‍රීඩා විෂයට අදාළ පාඨමාලා පවත්වන රාජ්‍ය ආයතනයන් හි බාහිර දේශකවරයෙකු ලෙස කටයුතු කිරීම.**<br>(එක් පාඨමාලාවක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 06)<br><br>**230 B දරන පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික එක් සහතිකයකට ලකුණු 02 බැගින්** | 20 |

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| **4. අමතර වෘත්තීය සුදුසුකම්** | ක්‍රීඩා පුහුණු කිරීම (ජාතික සංචිතයක පහත සඳහනන් තනතුරු දැරීම වෙනුවෙන් ලකුණු ලබා දේ.<br>ප්‍රධාන පුහුණුකරු - ලකුණු 10<br>සහය පුහුණුකරු - ලකුණු 08<br>අභ්‍යාසක - ලකුණු 06<br>ඉසව් පුහුණුකරු - ලකුණු 03<br><br>**තරග විනිශ්චය**<br>ජාත්‍යන්තර - ලකුණු 05<br>ජාතික - ලකුණු 03<br><br>**තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද**<br>ජාත්‍යන්තර - ලකුණු 04<br>ජාතික - ලකුණු 03 (උපරිම ලකුණු 06කට සීමා වේ.)<br><br>(සහතික කරන ලද ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතුය.)<br>**දිස්ත්‍රික් ක්‍රීඩා සම්බන්ධීකරණ නිලධාරී ලෙස කටයුතු කර තිබීම.**<br>(එක් වසරක් සඳහා ලකුණු 1 බැගින් උපරිම ලකුණු 10) | 20 |
| **5. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා** | නායකත්වය 02<br>පෞරුෂය 02<br>සන්නිවේදනය 01 | 05 |
| | **එකතුව** | **100** |

*සැ.යු.-*ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ තනතුරකට බඳවා ගැනීමේ දී ඉදිරිපත් කළ සහතික/සුදුසුකම් සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

05. සේවා කොන්දේසි :

5.1. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

06. අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2022/11/25 දින** හෝ ඊට පෙර ලැබෙන පරිදි අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක : 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මුලස්ථාන ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2022" ලෙස සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත් සෑම ආකාරයකින් ම සම්පූර්ණ විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම් පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි හෝ තැපෑලේ දී නැති වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් නොඑවා ප්‍රමාද කිරීමෙන් විය හැකි අලාභයන් අයදුම්කරු විසින් ම විඳ දරා ගත යුතුය. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

07. තමා දැනුවත් ව ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු/අයදුම්කාරිය හිතාමතාම යම් කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් එසේ *නැතහොත්* නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවක දී හෝ ඔප්පු වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

08. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධිවිධාන මෙන්ම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

09. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා,
ලේකම්,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය.

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය,
අංක.09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර සේවා ගණයේ (**MN** - 7-2016) මුලස්ථාන ක්‍රීඩා නිලධාරි තනතුරට සීමිත පදනමින් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය

1.
(I) මුලකුරු සමඟ අගට යෙදෙන නම :
අ) (සිංහලෙන්) :————.

ආ) (ඉංග්‍රීසියෙන්) :————.

(II) මුලකුරුවලින් හැඳින්වෙන නම් :

අ) (සිංහලෙන්) :————.

ආ) (ඉංග්‍රීසියෙන්) :————.

2.

(I) පෞද්ගලික ලිපිනය :————.

(II) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.

(III) කාර්යාලයීය ලිපිනය :————.

(IV) දුරකථන අංකය : ජංගම :————. කාර්යාලයීය :————.

3. ස්ත්‍රී / පුරුෂ භාවය : අදාළ කොටුව තුළ ලියන්න

පුරුෂ - 0

ස්ත්‍රී - 1

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. උපන් දිනය ඃ වර්ෂය :————. මාසය :————. දිනය :————.

6. 2021.09.26 දිනට වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————.

7. අ) ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ 1.1 ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේද?
අධ්‍යාපන, වෘත්තීය, සුදුසුකම් සහ පළපුරුද්ද
*ගැසට්* නිවේදනයේ 1.1 ඡේදයේ අනුව සුදුසුකම් ලබන්නේ 1.1 හි I,II,III යන ඒවායින් කුමන කාණ්ඩය යටතේ ද යන්න. :————.

ආ) සුදුසුකම් ලබන්නේ 1.1 හි III යටතේ නම් පහත තොරතුරු ඉදිරිපත් කරන්න. ඃ

I. උපාධිය ලද දිනය :————.

II. විශ්වවිද්‍යාලය / ආයතනය :————.

III. ලියාපදිංචි අංකය :————.

IV. බාහිර/අභ්‍යන්තර :————.

V. උපාධිය :————.

VI. විෂයයන් :————.

ඇ) මුල් පත්වීමේ දිනය :————.
තනතුරේ ස්ථිර කරන ලද දිනය :————.
දැනට දරන තනතුර :————.
ශ්‍රේණිය :————.
තනතුරට පත් වූ දිනය :————.

8. කාර්යක්ෂමතා කඩඉම්

| *කාර්යක්ෂමතා කඩඉම්* | *සමත්වීමට නියමිත දිනය* | *සමත් වූ දිනය* | *සහන කාලයක් ලැබී ඇත්නම් එම සහන කාලය හා සහන කාලය ලබා දුන් ලිපියේ දිනය හා අංකය* | *නිදහස් කර ඇත්නම් නිදහස් කිරීමේ ලිපියේ අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

9. අඩ වැටුප් / වැටුප් රහිත නිවාඩු විස්තර ඃ

| *වැටුප් රහිත ද, අඩ වැටුප් ද යන්න* | *ආරම්භ වූ දිනය* | *අවසන් වූ දිනය* | *කාලසීමාව (අවු. මාස හා දින)* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

10. සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක දී හෝ විනයානුකූල දඬුවමකට යටත්ව ඇත් ද? ඔව් / නැත

11. ඉහත "10" ට පිළිතුර "ඔව්" නම්,
විනය නියෝගයේ අංකය හා දිනය :————.

12. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවල දක්වන්න.

12.1. 1986/2 දරන 2016.09.26 දිනැති සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණයෙන් පසු,

| අනු අංකය | සේවය / ශ්‍රේණිය | පත් වූ / උසස් වූ/ අන්තර්ග්‍රහණය වූ දිනය | සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අවු. : මාස : දින : |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

12.2. 1986/2 දරන 2016.09.26 දිනැති සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණයෙන් පෙර,

| අනු අංකය | සේවය / ශ්‍රේණිය | පත් වූ / උසස් වූ/ අන්තර්ග්‍රහණය වූ දිනය | සක්‍රීය හා සතුටුදායක සේවා කාලය අවු. : මාස : දින : |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| අනු අංකය | සුදුසුකම් | ලබාගත් විශ්ව විද්‍යාලය / ආයතනය | වලංගුවන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

14. අමතර වෘත්තීය සුදුසුකම් (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් විස්තරාත්මක ලකුණු පටිපාටියේ අනු අංක 04 ට අදාළව)

| අනු අංකය | තරගාවලිය | වර්ෂය | කේවල / කණ්ඩායම් | ජයග්‍රහණය කළ ස්ථානය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

15.

I. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බව

II. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීම් හැර වෙනත් විනය දඬුවමකට ලක්වී ඇති/ නැති බව

III. සේවා කාලය තුළ අඩ වැටුප් හෝ වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති/ නැති බව

16. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම ඇතුළත් කර ඇති තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත්වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එසේ ඔප්පු වුවහොත් පත්වීම අවලංගු වීමට යටත්වන බව මම දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.

01. පූර්වාසන්න වසර 05 තුළ මෙම නිලධාරියාට එරෙහිව විනය කටයුතු කිසිවක් සිදු කර ඇති ද?
ඉදිරියේදී එසේ කිරීමට අදහස් කරන්නේ ද යන්න? ඔව්/නැත

02. පිළිතුරු "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

03. නිලධාරියාගේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේද? ඔව්/නැත

04. පිළිතුර "ඔව්" නම් ලබා ගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

| අනු අංකය | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසිය | කාලසීමාව | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| i. | ආයතන සංග්‍රහයේ v:2:5:4 | | |
| ii. | ආයතන සංග්‍රහයේ XII:16 | | |
| iii. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 10 | | |
| iv. | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 33 | | |
| v. | ආයතන සංග්‍රහයේ XII:36 | | |
| vi. | වෙනත් වැටුප් රහිත නිවාඩු | | |

05. අදාළ නොවන කොටස කපා හරින්න.

මෙම නිලධාරියා අයදුම් පත්‍ර කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බවත් සහතික කරමි.

මෙම දෙපාර්තමේන්තුවේ ..................... තනතුර දරන .................................. මයා / මිය / මෙය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර සේවා ගණයේ ((MN - 7-2016) මූලස්ථාන ක්‍රීඩා නිලධාරි තනතුරට අයදුම් කිරීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති / නැති බැවින් මෙම අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව

දිනය :————.

11-122

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව**

සෞඛ්‍ය අමාත්‍යාංශයට II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීම - 2022

ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අනුව දන්ත වෛද්‍ය නිලධාරි (II ශ්‍රේණිය) තනතුරේ පවත්නා පුරප්පාඩු 140න් සේවා ප්‍රමුඛතාවය මත හඳුනාගත් තනතුරු 94ක් සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙහි 04 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන දන්ත ශල්‍ය උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇති අනුයුක්ත කිරීම සඳහා වූ පුරප්පාඩු ලේඛනය හා අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් භාර ගැනීම **2022 නොවැම්බර් මස 14** වන දින පවුල් සෞඛ්‍ය කාර්යාංශ ශ්‍රවණාගාරයේ දී සිදු කෙරේ. එදින පෙ. ව. 9.00 සිට ප. ව. 1.00 දක්වා දන්ත වෛද්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සාමාජිකයන් එම ස්ථානයේ දී ඔබගේ සහතික පත්‍ර පරීක්ෂා කිරීම සහ සේවා ස්ථාන සඳහා මනාප සළකුණු කිරීම සඳහා ඔබට සහය වනු ඇත. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක 0112-692846 මගින් අධ්‍යක්ෂ (දන්ත වෛද්‍ය සේවා) කාර්යාලයෙන් විමසීම් කළ හැක.

02. *මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව මාසිකව, රු. 52,955-645x4-1,335 x 3-1,345 x 7-1,630 x 2-2,170 x 16-රු. 104,355 (SL-2-2016) මෙයට අමතරව රාජ්‍ය හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලින් සපයා ඇති ප්‍රතිපාදන අනුව ගෙවන දීමනා ද ඇතුළත් වේ. කෙසේ වුවද, ඔබ විසින් මෙම වැටුප් පරිමාණයේ 04 වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

03. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තවද ඔබගේ පත්වීම ලද දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට සහ නියෝගවලට ද ඔබගේ පත්වීම යටත් ය. තවද පත්වීම ලද දිනයේ සිට වසර 5ක් ඉකුත් වීමට පෙර 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඔබ විසින් ලබා ගත යුතු අතර එසේ නැතහොත් වැටුප් වර්ධක අත්හිටුවනු ඇත.

04. මෙම පත්වීම සඳහා බඳවා ගැනීමට කුසලතා ලේඛනය සකස් වන්නේ පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨයේ දන්ත වෛද්‍යවේදී උපාධිය ලත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් එම පීඨයෙන් නිකුත් කළ කුසලතා ලේඛනයට අනුකූලව සහ විදේශ දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබාගත් අයවලුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලබාදෙන කුසලතා අනුපිළිවෙළ අනුවය.

05. උපාධිධාරීන්ගේ අයදුම්පත් කුසලතා ලේඛනයේ අනුපිළිවෙලට අනුව සලකා බලනු ලැබේ.

06. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්‍රවලට අමුණා ඉදිරිපත් කළ යුතු අතර **2022 නොවැම්බර් මස 14 වැනි දින පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

(අ) නිසි පරිදි පුරවා අත්සන් කොට සහතික කරන ලද අයදුම්පත හා අභිමතය පළ කිරීමේ ආකෘති පත්‍රය
(ආ) උප්පැන්න සහතිකයේ පිටපත් තුනක් (03)
(ඇ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ පිටපත් තුනක් (03)
(ඈ) ජාතික හැඳුනුම්පතේ දෙපසම දැක්වෙන පරිදි ලබාගත් ඡායා පිටපත් තුනක් (03)

07. කුසලතා ලේඛනය, පුරප්පාඩු ලේඛනය, II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීමේ නිවේදනය හා අභිමත ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය අයදුම්කරුවන් හට www.health.gov.lk වෙබ් අඩවියට පිවිස හෝ අධ්‍යක්ෂ (දන්ත සේවා) කාර්යාලයෙන් ලබා ගත හැක.

08. අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රයේ තමා කැමති සේවා ස්ථානය ලකුණු කිරීමේ දී තම කුසලතා අංකයට සමාන හෝ වැඩිපුර සේවා ස්ථානයන් දක්වා එවන ලෙසට සියළුම අයදුම්කරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවෙහි අනුමැතිය පරිදි,

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත,
ලේකම්.

සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය''
අංක. 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

Priority Cadre Vacancies to be filled by Post Intern Dental Surgeons - 2022

| | Post | Decentralized Unit |
|---|---|---|
| 1 | Adolescent Dental Clinic St Mery's College DS | RDHS Hambantota |
| 2 | Adolescent Dental Clinic Siripura Vidyalaya DS | RDHS Polonnaruwa |
| 3 | BH Bibila DS | RDHS Monaragala |
| 4 | BH Medirigiriya DS | RDHS Polonnaruwa |
| 5 | BH Pottuvil DS | RDHS Kalmunai |
| 6 | BH Siyambalanduwa DS | RDHS Monaragala |
| 7 | BH Siyambalanduwa DS | RDHS Monaragala |
| 8 | BH Wellawaya DS | RDHS Monaragala |
| 9 | BH Wellawaya DS | RDHS Monaragala |
| 10 | DGH Ampara HO OMF | DGH Ampara - Line Ministry |
| 11 | DGH Ampara HO OMF | DGH Ampara- Line Ministry |
| 12 | DGH Ampara HO OMF | DGH Ampara - Line Ministry |
| 13 | DGH Ampara HO OMF | DGH Ampara - Line Ministry |
| 14 | DGH Hambantota HO Ortho | DGH Hambantota - Line Ministry |
| 15 | DGH Moneragala DS | DGH Monaragala - Line Ministry |
| 16 | DGH Polonnaruwa HO OMF | DGH Polonnaruwa - Line Ministry |
| 17 | DGH Trincomalee HO OMF | DGH Trincomalee - Line Ministry |

| | Post | Decentralized Unit |
|---|---|---|
| 18 | DGH Vavuniya HO OMF | DGH Vavuniya - Line Ministry |
| 19 | DH Akkarayankulam DS | RDHS Kilinochchi |
| 20 | DH Alupola DS | RDHS Rathnapura |
| 21 | DH Aralaganvila DS | RDHS Polonnaruwa |
| 22 | DH-B Pahalagiribawa DS | RDHS Kurunegala |
| 23 | DH Dambagalla DS | RDHS Monaragala |
| 24 | DH Dayagama DS | RDHS Nuwaraeliya |
| 25 | DH Delft DS | RDHS Jaffna |
| 26 | DH Eachchilampattu DS | RDHS Trincomalee |
| 27 | DH Ekiriyankumbura DS | RDHS Badulla |
| 28 | DH Hambegamuwa DS | RDHS Monaragala |
| 29 | DH Hingurukaduwa DS | RDHS Monaragala |
| 30 | DH Irakaman DS | RDHS Kalmunai |
| 31 | DH Kahatagasdigiliya DS | RDHS Anuradhapura |
| 32 | DH Kalthota DS | RDHS Rathnapura |
| 33 | DH Kithulgala DS | RDHS Kegalla |
| 34 | DH Kuchchaveli DS | RDHS Trincomalee |
| 35 | DH Lahugala DS | RDHS Ampara |
| 36 | DH Lunugala DS | RDHS Badulla |
| 37 | DH Lunugamvehera DS | RDHS Hambantota |
| 38 | DH Opatha | RDHS Galle |
| 39 | DH Padiyathalawa DS | RDHS Ampara |
| 40 | DH Passara DS | RDHS Badulla |
| 41 | DH Palankotte Placed at DH Rathganga | RDHS Rathnapura |
| 42 | DH Periyapandivirichan DS | RDHS Mannar |
| 43 | DH Roeberry DS | RDHS Badulla |
| 44 | DH Tharmapuram DS | RDHS Kilinochchi |
| 45 | DH Thottama DS | RDHS Ampara |
| 46 | DH Uvathissapura DS | RDHS Badulla |
| 47 | DHC Rassagala DS | RDHS Rathnapura |
| 48 | MOH Madulla DS | RDHS Monaragala |
| 49 | MOH Badalkumbura DS | RDHS Monaragala |
| 50 | DH Buttala DS | RDHS Monaragala |
| 51 | MOH Kalmunai South DS | RDHS Kalmunai |
| 52 | MOH Tanamalvila DS | RDHS Monaragala |
| 53 | PMCU Bibilegama DS | RDHS Badulla |
| 54 | RDHS Office Monaragala Relief/Mobile DS | RDHS Monaragala |
| 55 | BH Medirigiriya Placed at RDHS Office Polonnaruwa Mobile Relief DS | RDHS Polonnaruwa |
| 56 | RDHS Office Polonnaruwa Mobile/Relief DS | RDHS Polonnaruwa |
| 57 | RDHS Office Polonnaruwa Relief DS | RDHS Polonnaruwa |
| 58 | RDHS Office Puttalam Mobile/Relief DS | RDHS Puttalam |
| 59 | TH Anuradhapura HO OMF Placed as HO Resto | TH Anuradhapura - Line Ministry |
| 60 | TH Anuradhapura HO OMF | TH Anuradhapura - Line Ministry |
| 61 | TH Anuradhapura HO OMF | TH Anuradhapura - Line Ministry |
| 62 | TH Batticaloa HO OMF | TH Batticaloa - Line Ministry |
| 63 | TH Batticaloa HO OMF | TH Batticaloa - Line Ministry |
| 64 | DH Bogawanthalawa | RDHS Nuwaraeliya |

| | Post | Decentralized Unit |
|---|---|---|
| 65 | BH Mulankavil DS (to be placed at DGH Kilinochchi OMF Unit) | RDHS Kilinochchi |
| 66 | DH Kayts | RDHS Jaffna |
| 67 | DH Punkudutivu | RDHS Jaffna |
| 68 | DH Velanai | RDHS Jaffna |
| 69 | DH Pulasthigama | RDHS Polonnaruwa |
| 70 | TH Jaffna HO OMF | TH Jaffna - Line Ministry |
| 71 | TH Jaffna HO Resto | TH Jaffna - Line Ministry |
| 72 | ADC/MOH Horowpathana DS | RDHS Anuradhapura |
| 73 | BH Walasmulla | RDHS Hambantota |
| 74 | PGH Badulla HO OMF | PGH Badulla -Line Ministry |
| 75 | PGH Badulla HO Ortho | PGH Badulla - Line Ministry |
| 76 | PGH Badulla HO Ortho | PGH Badulla - Line Ministry |
| 77 | PGH Badulla HO Resto | PGH Badulla - Line Ministry |
| 78 | DH Galewela | RDHS Matale |
| 79 | DGH Nawalapitiya HO OMF | DGH Nawalapitiya - Line Ministry |
| 80 | DH Nelubewa | RDHS Anuradhapura |
| 81 | MOH Monaragala DS | RDHS Monaragala |
| 82 | DH - Mooloya to be Placed at DH Highforest | RDHS Nuwaraeliya |
| 83 | DH Kahataruppa | RDHS Badulla |
| 84 | BH Welimada | RDHS Badulla |
| 85 | MOH Giradurukotte placed at PMCU Hebarawa | RDHS Badulla |
| 86 | MOH Lunugala Placed at PMCU Mahadowa | RDHS Badulla |
| 87 | BH Diyathalawa HO OMF | RDHS Badulla |
| 88 | BH Mahiyanganaya HO Ortho | RDHS Badulla |
| 89 | DH Sarniya placed at DH Hakgala | RDHS Badulla |
| 90 | DH Kanaverella placed at PMCU Namunukula | RDHS Badulla |
| 91 | DH Kandagolla Placed at PMCU Kappetipola | RDHS Badulla |
| 92 | DH Karkils | RDHS Badulla |
| 93 | DH Meedumpitiya | RDHS Badulla |
| 94 | DH Ehetuwewa | RDHS Kurunegala |

## Merit Order Of Post Intern Dental Surgeons Who Are Completing Internship On 14/07/2022

| *Rank* | *Full Name* |
|---|---|
| 1. | Sumali Randhini Sumithrarachchi |
| 2. | Ekanayake Mudiyanselage Kanchana Medhavi Kumari Weerakoon |
| 3. | Sathiyaseelan Sajeevan |
| 4. | Jayathungage Dona Sajani Saumya |
| 5. | Pathirannehelage Don Dhanushka Madhuranga |
| 6. | Sahani Anupama |
| 7. | Don Yasora Harindi Kannangara |
| 8. | Atalla Wedaralalage Sharala Harshani Thilakaratne |
| 9. | Lakshan Randika Galagamaarachchi |
| 10. | Madurapperuma Arachchige Sandara Wayangi Madurapperuma |
| 11. | Siriwardhana Hewage Ayesha Shiranthi |
| 12 | Tissadeniye Gedara Hansani Kawshalya Tissadeniya |

| *Rank* | *Full Name* |
|---|---|
| 13. | Thena Handige Sandali Hansini De Silva |
| 14. | Buddhini Anjana Weerathunga Gamage |
| 15. | Dannangoda Gamage Chathuri Nuwanjala |
| 16. | Yashodani Piumila Senarathne |
| 17. | Henakaralalage Tharanga Dhananjani |
| 18. | Buddhi Prabha Anushini Thennakoon |
| 19. | Hetti Pathirannahalage Sameera Thilini Sri Pathirana |
| 20. | Surani Sandamali Liyanapathirana |
| 21. | Kamburawala Kankanamge Dona Thilini Jayanka Ranaweera |
| 22. | Neluni Dilinika Abeysinghe |
| 23. | Mohammed Uvaies Fathima Fawmina |
| 24. | Hondamulle Gedara Dasuni Disantha Hondamulla |
| 25. | Ranasinhage Ravindu Methmal Perera |
| 26. | Sundarapperuma Mohottalage Udari Amanda Sundarapperuma |
| 27. | Magalage Bhagya Jeewani |
| 28. | Kurukulasuriyage Sewwandi Ashani Perera |
| 29. | Serasinghe Pathiranage Sachini Imalka |
| 30. | Isurini Piyumika Nirmani Batuwantudawa |
| 31. | Liyana Kankanamalage Pubudinie Lahiruka Wijewardane |
| 32. | Waduge Amila Supun Kumara |
| 33. | Gimhara Lakshani Pallewala |
| 34. | Jayasinghe Arachchige Madushani Nisansala Karunathilaka |
| 35. | Rathu Durage Virajie Lanka |
| 36. | Thiluckshana Paramesvarampillai |
| 37. | Batawala Mahanthe Arachchige Nimali Lakmini Kumari |
| 38. | Rasnayaka Mudiyanselage Gamunu Deshapriya Bandara |
| 39. | Kadupitiya Arachchige Madara Kasuni |
| 40. | Mahamendige Yashodha Madhuwanthi Mendis |
| 41. | Maddumage Malsa Dilshani Maddumage |
| 42. | Hashani Madhushika Dharmawardhane |
| 43. | Hetti Mudiyanselage Tharaka Nimesh Danawardhana |
| 44. | Weerakoon Mudiyanselage Hiran Madhushanka Weerakoon |
| 45. | Witharanage Chamath Thisaru Kumara |
| 46. | Weerapanage Deshala Praveen |
| 47. | Kekulandara Mudiyanselage Chamini Buddhika Kekulandara |
| 48. | Wijesingha Samarakkodilage Senesh Chanakya Wimalathunga |
| 49. | Dehiwalage Don Sapna Nilakshi |
| 50. | Malimage Dona Piyumi Ayesha |
| 51. | Senarath Haputhanthrige Vinidu Udani |
| 52. | Munasingha Arachchige Tharindu Lakmal |
| 53. | Pavithra Nesarethinam |
| 54. | Jayakumar Amirthan |
| 55. | Gayathri Chamodi Haputhanthri Gamage |
| 56. | Munasingha Hewage Sewwandi Madushani Fernando |
| 57. | Pilanegoda Malaweera Arachchige Anushka Sajith Dharmathilaka |
| 58. | Dissanayake Mudiyanselage Hasitha Jayasiri Dissanayake |
| 59. | Appuhami Mudiyanselage Asiri Chinthaka Amarasinghe |
| 60. | Thiyagarasa Vathsalakumary |

| *Rank* | *Full Name* |
|---|---|
| 61. | Kudagama Liyanage Chathurika Dilrukshi |
| 62. | Samithyah Sriskandarajah |
| 63. | Karunanayaka Arachchilage Samith Chathuranga Premarathna |
| 64. | Karuna Arachchilage Hirosha Vichakshani Rathnayaka |
| 65. | Sothinathan Vithyagaran |
| 66. | Weerahannadige Dileepa Nishani Fernando |
| 67. | Kariyapperuma Mudiyanselage Venuri Kulanika Rekogama |
| 68. | Rishanthini Punniyarajah |
| 69. | Basnayaka Mudiyanselage Tharindu Kosala Basnayaka |
| 70. | Padukka Vidanalage Hansani Dilakshika |
| 71. | Mohamed Rafeek Fathima Shurfa |
| 72. | Isuru Akalanka Athukorala |
| 73. | Liyana Ralalage Chathura Shehan Bandara Liyanage |
| 74. | Thayanantharajah Aranie |
| 75. | Chandran Biranavan |
| 76. | Francis Xavier Shanil Meshak |
| 77. | Herath Mudiyanselage Roshan Shalika Herath |
| 78. | Neruja Sabaratnam |
| 79. | Kallora Gedara Wijekoon Mudiyanselage Wathsala Erandathie Dayananda |
| 80. | Karunakaran Rojithan |
| 81. | Walakulu Arachchige Dilun Chalindu Dilshan |
| 82. | Pathahagawa Gedara Anjali Umesha Chandrarathne |
| 83. | Bogoda Arachchige Jeewani Apsara Bogoda |
| 84. | Walimini Arachchige Kaushan Madhuwantha Weerasinghe |
| 85. | Senarath Pathirana Chathur Dhanushka |
| 86. | Salpadoru Hewawasam Wedige Mahesh |
| 87. | Fathima Sarah Jameel |
| 88. | Sauri Nirmani Dias |
| 89. | Wanninayaka Mudiyanselage Sakuntha Vidurath Ratnapreya |
| 90. | Aarani Poravi Nadarajah |
| 91. | Pairavy Shanmugaratnam |
| 92. | Liyanapathirennehelage Hasanka Somarathe |
| 93. | Janarathanan Ratshayini |

**Application for Post-Intern Appointments of Grade Dental Officers - 2022**

(Please send a soft copy of the duly filled application form to the email "directorateofdentalservices@gmail.com" on or before 01/08/2021)

1. Last name : ..........................................................................................
2. Initials : ..........................................................................................
3. Date of Birth : Year ....... Month ....... Date....... Gender : Male ☐ Female ☐
4. Postal Address : ..........................................................................................
5. NIC No. : ..........................................................................................
6. Contact No. : 1) ......................................
   2) ......................................
7. E-mail : ..........................................................................................
8. Nationality : ..........................................................................................

9. Marital status : ..........................................

10. Date of graduation : ..........................................

11. University of graduation : ..........................................

12. List of stations/posts according to your preference order :

*Note* : Each applicant must fill all the stations/posts according to the preference. Copy from the vacancy list published in the web and paste in to this document is preferred.

| Preference order | Station/Post |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| 09 | |
| 10 | |
| 11 | |
| 12 | |
| 13 | |
| 14 | |
| 15 | |
| 16 | |
| 17 | |
| 18 | |
| 19 | |
| 20 | |
| 21 | |
| 22 | |
| 23 | |
| 24 | |
| 25 | |
| 26 | |
| 27 | |
| 28 | |
| 29 | |
| 30 | |
| 31 | |
| 32 | |
| 33 | |
| 34 | |
| 35 | |
| 36 | |
| 37 | |
| 38 | |
| 39 | |
| 40 | |
| 41 | |
| 42 | |
| 43 | |
| 44 | |
| 45 | |
| 46 | |
| 47 | |
| 48 | |
| 49 | |
| 50 | |
| 51 | |
| 52 | |
| 53 | |
| 54 | |
| 55 | |
| 56 | |

| Preference order | Station/Post |
|---|---|
| 57 | |
| 58 | |
| 59 | |
| 60 | |
| 61 | |
| 62 | |
| 63 | |
| 64 | |
| 65 | |
| 66 | |
| 67 | |
| 68 | |
| 69 | |
| 70 | |
| 71 | |
| 72 | |
| 73 | |
| 74 | |
| 75 | |
| 76 | |
| 77 | |
| 78 | |
| 79 | |
| 80 | |
| 81 | |
| 82 | |
| 83 | |
| 84 | |
| 85 | |
| 86 | |
| 87 | |
| 88 | |
| 89 | |
| 90 | |
| 91 | |
| 92 | |
| 93 | |
| 94 | |
| 95 | |
| 96 | |
| 97 | |
| 98 | |
| 99 | |
| 100 | |

——————,
Signature of the applicant.

Date :——————.

II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

සෞඛ්‍ය අමාත්‍යාංශය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
කුසලතා අංකය....................................
පත්කරන ලද සේවා ස්ථානය.....................
පරීක්ෂා කළේ.......................................
බලය පවරන ලද්දේ.................................

01. සම්පූර්ණ නම :.......................................................................................................
(ඔබ ඉහත සඳහන් කළ නම හා පේරාදෙනිය දන්ත වෛද්‍ය පීඨයෙන් ඉදිරිපත් කර ඇති කුසලතා ලේඛනයේ සඳහන් නම හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ දැක්වෙන නම අතර වෙනසක් තිබේ නම් කරුණාකර ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් හෝ ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කරන්න.)

02. ජාතික හැඳුනුම්පත් අංකය :......................................................................................................

03. උපාධිය ලැබූ වසර සහ මාසය :...............................................................................................

04. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය :..............................................................................

05. ලිපිනය :.......................................................................................................................

06. දුරකතන අංකය :...............................................................................................................

07. කාණ්ඩය :.......................................................................................................................

ඉහත ම විසින් සපයා ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත ම විසින් සඳහන් කළ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට තහවුරු වුවහොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වන බව ද අවබෝධ කර ගෙන සිටිමි. තව ද අභිමතයන් ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රයන් හි ම විසින් සඳහන් කළ ස්ථාන අනුපිළිවෙළ අයදුම්පත් කැඳවන අවසන් දිනට පසු කිසිදු හේතුවක් මත වෙනස් කළ නොහැකි බව ද අවබෝධ කර ගෙන සිටින බවට මෙයින් සහතික වෙමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

11-124

---

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම් - අවලංගු කිරීම

රත්නපුර දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අංක 2301 හා 2022.10.07 දින අංක 108 දරන නිවේදනයේ මා විසින් පළ කරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර |
|---|---|---|
| රත්නපුර | කුරුවිට | එරත්න කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය |

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 18 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

11-10

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංශෝධනය කිරීමයි

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන III කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2020 (2022) කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,284 හා 2022.06.10 දිනැති *ගැසට්* පත්‍රයෙන් ප්‍රසිද්ධියට පත්කර ඇති ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 (2022) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2022.12.31** දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

ඒ අනුව උක්ත *ගැසට්* නිවේදනයෙ හි 01 හා 03 ඡේදයන් හා ආදර්ශ අයදුම්පතෙහි අංක 12 අ (ii), ආ (ii) සඳහා පහත සංශෝධනයන් ඇතුළත් කරනු ලබයි. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01 ඡේදය :

අංක 1930/12 හා 2015.09.01 දිනැති රජයේ *අතිවිශේෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත පාඨමාලාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් **2023 පෙබරවාරි මස** සිට සති අන්ත පාඨමාලාවක් ලෙස සති 15ක් පුරා සෙනසුරාදා දිනයන් හි පැවැත්වීම ආරම්භ කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

03 ඡේදය :

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත් පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මධ්‍යම රජයේ නිලධරයෙකු නම් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම් ඔවුන් සේවය කරන පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, **2022 දෙසැම්බර් මස 31** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, **පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනය වෙත තම අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2020 (2022)" ලෙස සඳහන් විය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු පරීක්ෂණයකින් තොරව ප්‍රතික්ෂේප කිරීමට පීඨාධිපති වෙත බලය පිරිනමනු ලැබේ.

ආදර්ශ අයදුම්පත :

12. (අ) ඔබ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු නම්,

(ii) **2022.12.31** දිනට I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය : අවු. ☐☐ මාස ☐☐ දින ☐☐

(තමන් විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද I ශ්‍රේණියට උසස්වීම් ලැබූ ලිපියේ පිටපත ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.)

(ආ) ඔබ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයෙකු නම් :

(ii) **2022.12.31** දිනට II ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය : අවු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

**එම්. එම්. පී. කේ. මායාදුන්නෙ,**
**ලේකම්,**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

2022 ඔක්තෝබර් 27 වැනි දින
රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(*ගැසට්* නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය www.pubad.gov.lk වෙතින් භාගත කරගත හැක.)

11-89

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/ සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (2023)**

First Efficiency Bar Examination for Senior Statisticians/Statisticians in the Department of Census and Statistics - 2015 (2023)

01. ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2023 මාර්තු** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

03. *විභාග ගාස්තු* :

විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර කිහිපයක දී හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගය සඳහා හෝ එක් විෂයයක් හෝ විෂයයන් කිහිපයක් සඳහා හෝ මුල්ම වතාවට අයදුම්කරන අපේක්ෂකයින්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන්පසු අයදුම්කරන ඕනෑම වාරයක දී එක් විෂයයක් සඳහා රු. 600 ක විභාග ගාස්තුවක් ද, විෂයයන් දෙකක් හෝ ඊට වැඩිනම් හෝ සම්පූර්ණ විභාගය සඳහා ම නම් රු. 1,200 ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උපතැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ.

(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

04. *අයදුම්පත්* :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින් ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2022 දෙසැම්බර් මස 02 වැනි දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, විභාග සංවිධාන (ආයතනික) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව* :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශීය ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

වර්තමානයේ පවතින Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඔබගේ සහ විභාග කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව සඳහා සියලු විභාග අපේක්ෂකයින් විභාග ශාලාවට ඇතුළු වීමට පෙර සබන් හෝ පිරිසිදුකාරකයක් භාවිත කර දෑත් සෝදා, මුඛ ආවරණ පැළඳ පැමිණිය යුතු අතර උන, සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස ආදී රෝග ලක්ෂණ ඇත්නම් ඒ බව විභාගය ආරම්භයට පෙර ශාලාධිපතිට දැනුම් දිය යුතු බව කාරුණිකව දන්වමි.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීමට අදාළ නම්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත, විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහි දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර, එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමුකර විමසා සිටීම ප්‍රතිඵලදායී වනු ඇත.

07. විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිය ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ විධායක ශ්‍රේණියේ, නිලධාරියෙකු හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය. එමෙන්ම, විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

08. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ගෙන් පළමුවර විභාගයට පෙනී සිටින නිලධාරින් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ. තමාට නියමිත විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතු අතර, තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ලෙස, රාජ්‍ය සේවයට ඇතුළත් වූ වීම සඳහා පැවැති අදාළ තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද, තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට ඇතුළත් වූ අයදුම්කරුවකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලු ම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

11. *විභාග පටිපාටිය* :

ඉහත තනතුරට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. පරිපාලනය | පැය 02 | 100 | 40% |
| 2. රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 02 | 100 | 40% |
| 3. ඉංග්‍රීසි | පැය 02 | 100 | 40% |
| 4. ව්‍යවහාරික සංඛ්‍යානය | පැය 03 | 100 | 40% |

(01) පරිපාලනය (විෂයය අංක 01)

I කොටස - පරිපාලනය

II කොටස - කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. VI, VII, IX, XI, XII, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII

- *ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය* :

(*a*) එක් කොටසකට ප්‍රශ්න හතර බැගින් ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.

(*b*) I හා II කොටස්වලින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(*c*) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

(02) රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංක 02) මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද මත සැකසේ.

I - සියලුම වගන්ති
II - සියලුම වගන්ති
III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1, 2, 3, 4 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1, 2, 3, 4 සහ 6 වන වගන්ති

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :

(a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න හයකින් සමන්විත වේ. ප්‍රශ්න ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
(b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
(c) සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

(03) ඉංග්‍රීසි (විෂයය අංක 03)

*English Grammar*

A suitable level of proficiency on the following forms of grammar in spoken and written language is expected from the candidate.

- Tense and Number
- Sentences (Simple/Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

*Writing Skills* :

The knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Internal modes of Communication
- Formal Correspondence skills
- Writing Descriptions/Explanations
- Summary writing skills
- Report Writing Skills
- Minutes of Meeting/Agendas/Invitations
- Comprehension

*Reading skills* :

Candidate's ability to comprehend a printed text, infer meaning and verbal/written interpretation is expected.

* Reading and understanding the specific and general meaning of the printed text
* Reading and interpretation (Verbal/written)
* Understanding the cohesion and coherence of a passage.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :

(a) ප්‍රශ්න පත්‍රයේ පහත කරුණු සම්බන්ධ ප්‍රශ්න අඩංගු වේ. :
(i) ව්‍යාකරණ
(ii) අවබෝධය
(iii) වාග්මාලාව
(iv) රචනා

(b) සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතුයි.

(04) ව්‍යවහාරික සංඛ්‍යානය (විෂයය අංක 04)
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කර්මාන්ත, කෘෂිකර්ම සංඛ්‍යාති, ජාතික ගිණුම්, තොරතුරු තාක්‍ෂණ (දත්ත සැකසුම්), නියැදි සමීක්‍ෂණ, ජන සංගණන හා ප්‍රජා විද්‍යා, මිල දර්ශකාංග හා සිතියම් යන අංශ මගින් සිදුකරනු ලබන සංඛ්‍යානමය කාර්යයන් පිළිබඳව අදාළ නිලධාරීන්ගේ දැනුම ඇගයීම පිණිස සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

- ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :
(a) ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න අටකින් සමන්විත වේ. ප්‍රශ්න, ව්‍යුහගත, අර්ධ ව්‍යුහගත හා රචනා ස්වරූපය වේ.
(b) ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

11.1 එක් එක් විෂයයයෙන් සාමාර්ථය ලැබීම සඳහා 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතු අතර, කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීම සඳහා සෑම විෂයයකින්ම සාමාර්ථය ලැබිය යුතු ය. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිපවරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්‍ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

### ආදර්ශ අයදුම්පත්‍රය

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ/සංඛ්‍යාලේඛනඥ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015(2023)***

First Efficiency Bar Examination for Senior Statisticians / Statisticians in the Department of Census and Statistics - 2015 (2023)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. සේවා ස්ථානය හා ලිපිනය :

2.1 සේවා ස්ථානයේ නම :————————————.

2.2 රාජකාරි ලිපිනය :————————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

3.3 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.4 ජංගම දුරකථන අංකය :

04. ඔබ ඉදිරිපත් වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන් :

(ගැසට් නිවේදනයේ 10 වන ඡේදය බලන්න.)

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |
| 04. | | |

05. දැනට දරන තනතුර ඃ

5.1 පත්වීම් ලිපියේ අංකය :————.

5.2 පත්වීම් දිනය :————.

06. ඔබ විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට ද? :————.

6.1 විභාගයට අයදුම් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම් ගෙවන ලද විභාග ගාස්තුව :————.

6.2 ලදුපත් අංකය :————.

6.3 දිනය :————.

| ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).<br>(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, ප්‍රකාශ කරන අතර මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම ඃ*

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක වන මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... ........................... මයා/ මිය/ මෙනෙවිය ........................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් මම සහතික කරමි.

————————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-102

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (2023)

### Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics - 2015 (2023)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු :*
විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකක දී හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයයකට හෝ පළමු වරට අයදුම් කරන අපේක්ෂකයන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයකදී එක් විෂයයක් සඳහා රු. 250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු. 500 ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත :*
අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව, ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2022 දෙසැම්බර් මස 02 වැනි දිනට පෙර** ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

වර්තමානයේ පවතින Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඔබගේ සහ විභාග කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව සඳහා සියලු විභාග අපේක්ෂකයින් විභාග ශාලාවට ඇතුළු වීමට පෙර සබන් හෝ පිරිසිදු

කාරකයක් භාවිත කර දැත් සෝද, මුඛ ආවරණ පැළඳ පැමිණිය යුතු අතර උණ, සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස ආදී රෝග ලක්ෂණ ඇත්නම් ඒ බව විභාගය ආරම්භයට පෙර විභාග ශාලාධිපතිට දැනුම් දිය යුතු බව කාරුණිකව දන්වමි.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය.

06.3 විභාගය සඳහා පෙනී සිටින දිනයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08.1. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍යය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් තරග විභාග යට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද, තරග විභාග යකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලු ම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

08.2 විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරක දී හෝ කිහිපවරක දී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. විභාග පටිපාටිය.

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 1 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➤ මේ සඳහා ආයතන සංග්‍රහයේ XV,XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගත යුතු වේ.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය* :<br>(*a*) මුළු ප්‍රශ්න ගණන 05 කි. 1 වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් යුක්ත වන අතර, අනෙක් ප්‍රශ්න හතර ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්නවලින් සමන්විත වේ.<br>(*b*) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

| | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය |
|---|---|---|
| 2 | මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. : (*a*) vi වන පරිච්ඡේදය, ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට 396 දක්වා) සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතුය. |
| | | (*b*) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ඒවායේ සියලුම සංශෝධන පිළිබඳව ද අවධානයට ගත යුතුය.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(*c*) මුළු ප්‍රශ්න ගණන 05කි. I වන ප්‍රශ්නය කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 10කින් යුක්තවන අතර අනෙක් ප්‍රශ්න හතර ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ සමන්විත වේ.<br>(*d*) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

*සටහන -*

- ඉහත විෂයයන්ට වෙන වෙන ම පෙනී සිටිය හැකිය.
- නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

13. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදන සඳහන් කරුණු බලපැවැත් වේ.

අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015(2023)***

Second Efficiency Bar Examination for Grade I Statistical Officers in the Department of Census and Statistics - 2015 (2023)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය : | | | | | | | | | | |

ස්ථාවර දුරකථන අංකය : | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂ භාවය : [ ]
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/විෂයයන් :

| *අනු අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |

06. උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

07. තනතුර :————.

7.1 දැනට දරන තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළග තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් . . . . . . . ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන්

හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*සටහන* .- තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම* :

මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන......... .......................... මයා/ මිය/ මෙනෙවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :
1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :——————————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-103/1

---

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (2023)

## First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics - 2015 (2023)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයකදී එක් විෂයයක් සඳහා රු. 250/- ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය

සඳහා රු. 500/- ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට හෝ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. (විභාග ගාස්තු ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත* : අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. මෙම ආදර්ශ අයදුම්පත අනුව A 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අයදුම්කරුවන් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2022 දෙසැම්බර් මස 02 වැනි දිනට** පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ. :

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය. වර්තමානයේ පවතින Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඔබගේ සහ විභාග කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව සඳහා සියලු විභාග අපේක්ෂකයින් විභාග ශාලාවට ඇතුළු වීමට පෙර සබන් හෝ පිරිසිදුකාරකයක් භාවිත කර දෑත් සෝද, මුඛ ආවරණ පැළඳ පැමිණිය යුතු අතර උන, සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස ආදී රෝග ලක්ෂණ ඇත්නම් ඒ බව විභාගය ආරම්භයට පෙර විභාග ශාලාධිපතිට දැන්විය යුතු වේ.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළයුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

06.1 විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාලවන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

06.2 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගත යුතුය.

06.3 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති, ප්‍රථම වතාවට විභාගය සඳහා පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබා දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරඟ විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරඟ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරඟ විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතුය. විභාගයට නියමිත සියලුම විෂයයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වේ.

10. *විභාග පටිපාටිය*

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත. :-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 3. මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | ➢ දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රමථ ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $X^2$ පරීක්ෂා, ජාල රේඛය හා සංඛ්‍යාත වක්‍ර කේන්ද්‍රික ප්‍රවණතාව හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යයන, විචලතාව, චතුර්ථක හා සම්මත අපගමනය) නියැදුම්වාදයේ මූලධර්ම, නියැදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාව, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(a) ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්න 04 කින් සමන්විත වේ.<br>(b) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. |
| 2 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛයන් පිළිබඳව ද අවධානයට ගත යුතු වේ.<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(a) ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්න 05 කින් සමන්විත වේ.<br>(b) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. |
| 3 | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු. රෙ. 1 සිට 68 දක්වා)<br><br>➢ III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු. රෙ. 124 සිට 147 දක්වා)<br><br>*ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය :*<br>(a) ප්‍රශ්න පත්‍රය ව්‍යුහගත රචනා/රචනා වර්ගයේ ප්‍රශ්න 05 කින් සමන්විත වේ.<br>(b) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය. |

*සටහන* -

➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකිය.
➢ නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%කි. විභාගයට ඉදිරිපත් වූ සියලු අයදුම්කරුවන්ගේ ලකුණු ඇතුළත් ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් අධ්‍යක්ෂ ජනරාල්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදුකරනු නොලැබේ. විභාගයට නියමිත විෂයයන් එක් වරකදී හෝ කිහිපවරකදී සම්පූර්ණ කිරීමට අයදුම්කරුවන්ට ඉඩකඩ ඇත.

14. මෙම *ගැසට්* නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරනු බලපැවැත්වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
සංඛ්‍යාන මන්දිරය,
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරින් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015 (2023)***

**First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics 2015 (2023)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

ස්ථාවර දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

03. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

04. 4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.) ☐

05. ඔබ මෙවර විභාගයේදී ඉදිරිපත්වන විෂයය/විෂයයන් :

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

06. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

07. දැනට දරන :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් …………… ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම* :

මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ......... .......................... මයා/ මිය/ මෙනෙවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

____________,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :—————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිලමුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-103/2

---

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

### රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

### ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2022/2023

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

### පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව
### NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 22,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 31,000

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**ත්‍රිමාණ සජීවිකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06(අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එක සේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.19,000

**ඕෆ්සෙට් පත් ලිතෝකරණය - Sheetfed Offset Printing**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැළි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 0112686162, 0112679791, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊ-මේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
දුරකථන : 0662222172, 071 0554298.

09-157

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2022.11.04 | සිකුරාදා | 2022.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.11 | සිකුරාදා | 2022.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.18 | සිකුරාදා | 2022.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.25 | සිකුරාදා | 2022.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2022.12.02 | සිකුරාදා | 2022.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.09 | සිකුරාදා | 2022.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.16 | සිකුරාදා | 2022.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.23 | සිකුරාදා | 2022.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.30 | සිකුරාදා | 2022.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2023 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2023.01.05 | බ්‍රහස්පතින්දා | 2022.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.13 | සිකුරාදා | 2022.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.01.20 | සිකුරාදා | 2023.01.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2023.10.27 | සිකුරාදා | 2023.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.